FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු


# රංගිරි ශ්‍රී ලංකා

## RANGIRI SRI LANKA NEWSPAPER




FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු



ශ්‍රී.බු.ව. 2565- ක්‍රි.ව. 2021
සැප්තැම්බර් (බිනර)

මාසික බෞද්ධ සාර සංග්‍රහය - අන්තර්ජාල කලාපය

34






රංගිරි ශ්‍රී ලංකා රූපවාහිනිය

රංගිරි ශ්‍රී ලංකා
RSL TELEVISION

UHF CH 60
PEO TV CH 22
Dialog Tv 21
Dish Tv 2532

රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය
දේශයේ රන් හඬ

රංගිරි ශ්‍රී ලංකා
RSL RADIO

FM 104.4 - 105.7

වෙබ් : www.rangirisrilanka.lk



රංගිරි දඹුල්ල සංවර්ධන පදනමේ ප්‍රකාශනයකි.



# බිනර පෝය වර්ණනාව

බරණැස ඉසිපතනයේ දී බුදුරජාණන් වහන්සේගේ ධර්මය අසා පැහැදුන පස්වග තවුසන් බුද්ධශ්‍රාවකයන් බවට පත්වූහ.එතැන් සිට විවිධ පිරිස් සසුන්ගත වූහ. විවිධ දුක්ගැහැට වලින් මිදීම පිණිස සසුන්ගතවීමට කාන්තා පිරිසද තීරණය කොට ඒ බව ආනන්ද තෙරුවන් වහන්සේ වෙතට ගොස් දන්වා සිටියහ.එම පිරිස් අතරේ ප්‍රධානත්වය දැරුවේ මහා ප්‍රජාපතී ගෝතමියයි.ඇයගේ ප්‍රධානත්වයෙන් රැස් වූ කුලකාන්තාවන් බුදුරජාණන් වහන්සේගෙන් මහණ උපසම්පදාව ඉල්ලා සිටියහ.බුදුරජාණන් වහන්සේ අවස්ථා දෙකම ප්‍රතික්ෂෙප කළසේක.නැවත නැවතත් ඉල්ලා සිටියෙන් අනඳ තෙරුන්ගේද මැදිහත්වීමෙන් පසු අෂ්ට ගරු ධර්ම ආරක්ෂා කළ හැකි නම් මහණ උපසම්පදාව ලබාදීමට බුදුරජාණන් වහන්සේ කැමති වූ සේක.ඉන්පසු මහාප්‍රජාපතී ගෝතමිය ප්‍රධාන කුලකාන්තාවන් රැසක් පැවිදි වූහ. මෙම උතුම් සිදුවීම බිනර පොහොය මූලික කරගෙන සිදු වූ බව ශාසන ඉතිහාසයෙහි සඳහන් වෙයි. එතැන් සිට දඹදිව පුරා තෙරණින් වහන්සේලා ව්‍යාප්ත වන්නටවිය.

ධර්මාශෝක අධිරාජයාගේ දියණිය වූ සංඝමිත්තා තෙරණින් වහන්සේ එවකට සිරිලක රජකළ දෙවනපෑතිස් රජුගේ ආරාධනයෙන් මෙරටට වැඩම කරවා අනුලා දේවිය ප්‍රධාන කුලකාන්තාවන් පැවිදි කරවීමෙන් පසු මෙරට භික්ෂුණී ආරාම ආරම්භ විය.අනුරාධපුර යුගයේ භික්ෂුණී ශාසනය ඉතා හොඳින් පැවැතුණු අතර එම යුගයෙන් පසු භික්ෂුණී ශාසනයේ පිරිහීමක් සිදු වී තිබේ.විවිධ බාධක හිරිහැර මෙයට හේතු වු බව ශාසනික තොරතුරු වලින් පෙනී යයි. නුවර යුගයේ යළි භික්ෂුණී ආරාම ඇති විය.නැවත වරක් විදේශීය බලපෑම් හේතුවෙන් භික්ෂුණී ශාසනය පිරිහීමට පත්විය.නිදහස ලැබීමෙන් පසු (1948) සියම්,බුරුම රටවලින් භික්ෂුණීන් මෙරටට ගෙන්වා යළි භික්ෂුණී ශාසනය ආරම්භ විය. වර්තමාන භික්ෂුණී ශාසනයේ දියුණුව ඇති වූයේ රංගිරි දඹුලු විහාරයෙහි වර්තමාන විහාරාධිපති අතිගරු මහානායක ඉනාමළුවේ ශ්‍රී සුමංගල ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ ප්‍රාධාන එම සංඝ සභාවේ කැපවීම නිසාමය. ජාතික, ආගමික විශිෂ්ඨ සේවාවක් භික්ෂුණී ශාසනයෙන් ඉටුවෙන බව සඳහන් කිරීම අතිශයෝක්තියක් නොවන්නේය.

බෞද්ධ ජනතාව,මෙම උතුම් පොහෝදින ආමිස ප්‍රතිපත්ති පූජාවන්හි යෙදෙමින් කල්ගත කරන බව සඳහන් කිරීමට පුළුවන.

ඇම්.ඩී.විජයවර්ධන

## පුදබිමක අසිරිය

# පොළොන්නරු තිවංක පිළිම විහාරය



පොළොන්නරු රාජධානිය තුළ නිර්මාණය කර ඇති විහාරයන් අතරින් සුවිශේෂී නිර්මාණයන් ලෙස තිවංක පටිමාඝරය හෙවත් තිවංක පිළිමගෙය හඳුන්වාදිය හැකි ය.පුරාවිද්‍යා ගවේෂණයන්ගේ විශේෂ අවධානයට යොමු වූ මෙම විහාරයට පුළුස්සන ලද ගඩොල් භාවිත කර ඇති බව නටඹුන් මගින් පැහැදිලි වෙයි.

මෙම විහාර අභ්‍යන්තරයේ නිමවා ඇති බුද්ධ ප්‍රතිමාව උරහිස, උකුල, දණහිස යන ස්ථාන තුනකින් නැමී ඇති නිසා ''තිවංක''යන නාමය භාවිතකර ඇති බව පිළිගත් මතයකි. මෙම විහාරය පිටත බිත්තියෙහි ගණදෙවි රූප, දේව රූප, බෝධි සත්ව රූප, සිංහ රූප, නෙළුම් මල යන රූප සිතුවම් කර තිබූ බවට සාධක හමු වී තිබේ. මෙම විහාර නිර්මාණය මහා පරාක්‍රමබාහු රජුගේ යැයි පිළිගත් මතයකි. පිළිමගෙයි වැඩ අවසන් කිරීමෙන් පසුව චිත්‍ර නිර්මාණය කරන්නට ඇතැයි විශ්වාසයක් පවතී.බුද්ධ චරිතයෙහි සඳහන්වන බෝධිසත්ව කතාවක්වන චුල්ලපදුම ජාතක කතාව,සාම ජාතක කතාව,සස ජාතක කතාව, වෙස්සන්තර කතාව යන කතාවක් සිතුවමට නගා තිබූ බවට සාධක තිබේ. මෙහි ඇඳ ඇති චිත්‍රවලට විශේෂ ඇඳුම් හා ආභාරණ ඇඳ තිබීම විශේෂත්වයක් සේ සැළකේ. මෙයට අමතරව දේව රූප සහ දේව විමාන නිර්මාණය කර අලංකාරකොට තිබූ බවට සාධක හමු වී ඇත.



ඓතිහාසික වශයෙන් ගත්කල පැමිණි වාස්තු විද්‍යාව පිළිබඳ තොතුරු රැසක් එක්තැනකදී පෙන්නුම් කරන ගොඩනැගිල්ලක් ලෙස මෙම විහාරය පෙන්වාදිය හැකිය. දෙස්,විදෙස් සංචාරයන්ගේ සිත් ඇදගන්නා සුවිශේෂී තැනක් වශයෙන් මෙම ස්ථානය අගය කළ හැකිය. මෙවැනි වැදගත් ස්ථාන නැරඹීම සඳහා පැමිණෙන ජනතාව මෙම ස්ථාන ආරක්ෂාකිරීම තම යුතුකම වන්නේය.

විජය තලවත්තේගෙදර



# ගුණදම් පුරන බිනර පෝයයි වස්විසීම් සම්ප්‍රදායේ මූලාරම්භයයි

ශ්‍රී ලංකාවේ බෞද්ධ ජනතාවට,බෞද්ධ භික්ෂූන් වහන්සේලාට බිනර පෝය දිනය සුවිශේෂී වූ දිනයකි. කාන්තාවන්ට නිවන් දොරටු විවර වූ ද ලෝකවාසී බෞද්ධ ජනතාවට ගුණ දහම් පුරමින් පිං රැස් කරගත හැකි වූ ද පෝහෝ දිනයකි. ඇසළ, නිකිණි, බිනර යන තුන් මාසයම භික්ෂූන් වහන්සේලාත් ගිහියාත් අතර අන්‍යොන්‍ය වශයෙන් යුතුකම් ඉටු කරන කාලයක් හැටියට සැලකිය හැකි ය.

මුල්වරට භික්ෂුණී ශාසනය පිහිටුවීමට බුදුරාජාණන් වහන්සේ අනුදැන වදාළේ මෙම බිනර පොහෝ දිනයයි.එබැවින් විශේෂ බෝධිපූජා, ධර්මදේශනා,ධර්ම සාකච්ඡා ,සිල් සමාදන් කරවීම, දන්දීම වැනි ආගමික පුණ්‍ය ක්‍රියා කටයුතු සිදු කරනු ලබයි.ශ්‍රී ලංකාවේ සෑම විහාරස්ථානයකම මෙම බිනර පෝය මුල් කරගෙන දානශීල භාවනා වැඩසටහන් ක්‍රියාත්මක වන අතර භික්ෂූන් වහන්සේලාගේත්, භික්ෂුණීන් වහන්සේලාගේත් දායක දායිකාවන්ගේත් මෙලොව පරලොව දෙලොව අභිවෘද්ධිය සලසාලන පෝය දිනයක් හැටියට සැලකිය හැකිය.වස්විසූ භික්ෂූන් වහන්සේලා තම විහාරස්ථානයේම රැඳී සිටිමින් විනය කර්මයන්හි යෙදීමෙන් දායක දායිකාවන්ගේ ආගමික කටයුතු වල නිරත වීමෙන් මෙම පුන් පොහෝ දිනයේ දී සිදු කරනු ලබයි.

මුල් කාලයේ දී බෞද්ධ භික්ෂූන් වහන්සේලා ගත කලේ සංචාරක ජීවිතයකි.එකල ස්ථිර වූ වාසස්ථානයක් තිබුනේ නැත.අනගාරික ජීවිතයක් ගත කළේය.අනගාරික යන්නෙහි තේරුම වන්නේ නිවහනක් නොවීය යනුවෙනි.බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ වස් විසීමේ සම්ප්‍රදායේ ආරම්භය වන්නේද එයයි.

විශේෂයෙන්ම මගධ ප්‍රදේශයේ වර්ෂා කාලය ඉතාම දුෂ්කර කාලයක් විය.පිණ්ඩපාතයේ වඩින භික්ෂූන් වහන්සේලාට නොයෙක් කරදර හිරිහැර වලට මූන පාන්නට සිදුවිය. එම දුෂ්කර කාලය නිසා එදා භාරතයේ සිටි සංචාරක ජීවිතය ගත කළ පරිබ්‍රාජිකාදීහූ මෙම වර්ෂාව පවතින කාල සීමාව වන තුම්මාසය එකම ස්ථානයක විසීය.ජෛනාදීනගේ මේ අන්ත අවිහිංසාවාදී ප්‍රතිපත්තිය අනුව කටයුතු කරමින් සිටි භාරත වැසියෝ වැසි කාලයේ අලුත වැඩෙන දලුලන තණකොළ පෑගීම මහා පාපකර්මයක් ලෙස සලකා බෞද්ධ භික්ෂූන් වහන්සේලාට චෝදනා නින්දා අපහාස කලහ.වැසි කාලයේ පිණ්ඩපාතයේ යෙදීමේදී වැස්සට තෙමී බෝහෝ කායික වූ අපහසුතාවන්ට මුණ දෙන්නට සිදු විය.වැස්සට ඇදුම් තෙමීම නිසා දකින අයගේ අප්‍රසාදයට ද හේතු විය.

එකල සමාජය පිළිගත් කාලීන අවශ්‍යතාවයක් ඉටු කිරීම සඳහන් මහජනතාවගේ ප්‍රසාදය සඳහාත් වස්විසීමේ සිරිත ආරම්භ විය.මෙයින් සිදු වූයේ එකතැන නතර වී සිටියා වූ පිරිසකට එකිනෙක අය ඇසුරු කිරීමට ඉතාමත් හොඳ අවස්ථාවක් බවට පත්වුණි.

ගිහි ජීවිතය ගත කරන පිරිසට තමන්ගේ ජීවිතය ඉතා සාර්ථකව පවත්වාගෙන යාම සඳහාත් තම දූ දරුවන්ගේ යහපත් හැදියාව චරිත සංවර්ධනය කර ගැනීම සඳහාත් ප්‍රඥාව දියුණු කරගැනීම සඳහාත්, දරුවන්ට හට අවවාද අනුශාසනා කිරීම සඳහාත්, ගිහිපැවිදි දෙපක්ෂයේ අවශ්‍යතාවන් ඉටුකරගැනීමටත් මෙම වස්කාලය හොඳ අවස්ථාවක් විය.

වස්කාලය තුළදී නොයෙක් පුද පූජා විධි සකස් වන්නට විය.ධර්මදේශනා ක්‍රම ඒ ඒ ප්‍රදේශවලට අනුව දියුණු විය.බෝධි පූජා පැවැත්වීම ඒ සඳහා ළමයින්ගේත් වැඩිහිටියන්ගෙන් සම්බන්ධතාවය ඒ සඳහා උනන්දුව ඇති විය.බෝධි පූජාව අවසානයේ පිරිත් දේශනා කිරීම අනුශාසනාවන් පැවැත්වීම ඒ ඒ ප්‍රදේශවලට අනුව දියුණු විය.

එපමණක් ද නොව මුළු මහත් සමාජයද යහපත් විය.පන්සිල් රකින සුවිශේෂී කරුණ සමාජයක් බිහිවිය.වස් තුන් මාසය අවසානයේ දී කෙරෙන කඨින පූජාවද බෞද්ධ ජනතාවගේ ඉතාම ජනප්‍රිය ආගමික චාරිත්‍රයක් බවට පත් විය.ඒ කඨින පූජාවද බෞද්ධ ජනාතාවගේ ශ්‍රද්ධාව වැඩිවන ආකාරයට ආගමික චාරිත්‍ර ධර්මයක් විය.වස්කාලය අවසානයේ දී එකිනෙක භික්ෂුවක් විසින් තම තමන්ගේ අතින් සුළු හෝ යම් කිසි ඇවතක් සිදු වුණි නම් එය ප්‍රකාශ කිරීමට අනෙක් භික්ෂුන්ට අවස්ථාව ලබා දීමෙන් මුළු සංඝ සමාජයේම පාරිශුද්ධිය ඇතිවෙන ආකාරයට සකස් විය.

වස් විසූ භික්ෂූන් වහන්සේලාට එක් තැනකට වී එක් නිවහනකට වී තම ආධ්‍යාත්මික දියුණුව ඇතිකර ගැනීමට ඉතාමත් හොඳ අවස්ථාවක් උදා කර ගන්නා ලදී.බිම්බිසාර රජතුමාගේ ඉල්ලීම පරිදි භික්ෂූන් වහන්සේලාට රජුන්ට අනුව ක්‍රියා කිරීමට අවස්ථාව ලැබුණි. අනුජානාමි භික්ඛවේ රාජානං අනවත්තිතුං

( මහාවග්ගපාලිය ) බුදුරාජාණන් වහන්සේ මුලදී වස්විසීම පමණක් දේශනා කළද පසුව කඨිනයක් පිළිගැනීමට ද අවසර දී තිබේ.'අනුජානාමි භික්ඛවේ වසසං වුත්ථානං භික්ඛූනං කඨිනං අත්ථරිතුං- වස්විසූ භික්ෂූන් වහන්සේලාට කඨිනය අතුරනට අනුදනිමියි වදාළහ.'

බුදු සසුනේ කලහැකි පිංකම් අතරින් උසස්ම පිංකම ලෙස කඨින පූජාව සඳහන් කළ හැකිය.එක අරාමයක වර්ෂයකට එක් වතාවත් පමණක් සිදු කළ හැකි ඉතාමත් වැදගත් පිංකමක් හැටියට කඨින පිංකම හැදින්විය හැකිය.

කඨිනය පූජා කල දායක පිරිසට ආනිසංස ලැබෙනවා සේම කඨිනය ලබාගත් භික්ෂුවක් අන් භික්ෂූන් වහන්සේලාටත් විශේෂ වරප්‍රසාද රාශියක් ලැබේ. ඒ වරප්‍රසාද අතර විහාරස්ථානයේ සිටින අන් භික්ෂූන්ට නොදන්වා ගම් වැදීමට පුලුවන. තුන්සිවුර තම අත්පස නොතිබුණත් ගමන් යා හැකි වීම, කැමති තරම් සිවරු පිළිගැනීමට හැකිවීම, හිතවත්කම මත දානයකට ආරාධනා කළ විට පිළිගැනීමට හැකිවීම, මාස 3ක කාලයක් තුළදී විහාරස්ථානයට පූජාකළ සිවුරු පිළිගැනීමට හැකිවීම. මහාවංග පාලියේ කඨිනක්ඛන්දකය විමසීමෙන් මෙම කඨින චීවර ආනිසංස පිළිබඳව තොරතුරු ලබා ගතහැකිය.

එච්.එම්.අයි.හේරත්
රැක් සෙවන
ලෙනදොර

# රාජ්‍ය පාලනය පිළිබඳ නිවැරදි දැක්මක්

ජන සම්මත ලෙස තෝරා පත්වෙන රාජ්‍ය පාලකයා ක්‍රියා කල යුතු ආකාරය ගැන නිවැරදි දැක්මන් ඉදිරිපත් කළ ප්‍රථම ශාස්ත්‍රවරයා ලෙස සැලකෙන්නේ බුදුරාජාණන් වහන්සේ ය.එයට පදනම් වූ හේතූන් රාශියක් ගෙනහැර දැක්වීමට පුළුවන. බුදුරාජාණන් වහන්සේ අවබෝධ කරගත් ධර්මය ඒ සඳහා උපයෝගී කරගත හැකිය.රාජ්‍යයක් ගත් විට එහි වෙසෙන ජනතාවට අවශ්‍ය පහසුකම් තිබිය යුතු ය.ජනතාවගේ බදු මුදල් වලින් යැපෙන රාජ්‍ය පාලනයක් ජනතාවට නොමඳව සේවා කටයුතු ඉටු කිරීමට බැඳී සිටින බව බුදුදහමෙහි දැක්වෙන දසරාජ ධර්මයෙන් පැහැදිලි වෙයි. දානය, සීලය, පරිත්‍යාගය, ඍජුබව, මෘදුබව, තපස, අක්‍රෝධය, අවිහිංසාව, අන්‍ය අදහස් ඉවසීම, විරුද්ධ මතයන්ට ගරුකිරීම යන කරුණු දහයක් වේ.මෙම කරුණු දහයම එකිනෙනකට මනා කොට බැඳී පවතී.දානය යනුවෙන් අදහස් වන්නේ තමා සතු දෙයක් තවත් කෙනෙකුට ලබා දීමයි.එය පූජා බුද්ධියෙන් දීමත් අනුග්‍රහා බුද්ධියෙන් දීමත් යනුවෙන් දෙවැදෑරුම් වේ.පිදීමට සුදුසු පුද්ගලයන්ට පරිත්‍යාග කිරීම පූජා බුද්ධියයි. නැති බැරි අයට දෙනු ලබන දීමනාව අනුග්‍රහා බුද්ධියයි.

රාජ්‍ය පාලකයෙකු තුළ මෙම ක්‍රමවේද දෙකම වන්නේ සුදුසු වන පරිසරයක් පැවැතුනහොත් පමණි.ඒ සඳහා අවශ්‍යවන පහසුකම් සැපයීමත් රාජ්‍ය පාලනයෙන් සිදුවිය යුතු ය.යහපත් ගුණගරුක සමාජයක් බිහිවීමට හේතු වේ.අවශ්‍ය අවස්ථාවල දී පරිත්‍යාගයන් සිදුකර ජනතාවට උපකාරීව ක්‍රියා කිරීමත් රාජ්‍ය පාලනයෙන් සිදුවිය යුතු සේවාවකි.ඒවා ලබා ගැනීම සඳහා ද ජනතාවද නීතිගරුකව කටයුතු කිරීම ඉතා වැදගත් වේ.

රටේ වෙසෙන ජනතාවගේ යහපත සඳහා තීරණ ගැනීමේ දී නිවැරදි ඍජු ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම වැදගත් බව දස වැදෑරුම් කරුණු අතරෙහි සඳහන් වෙයි.එසේ නොවුවහොත් ජනතාව අතර ආරවුල් පැනනගී. සංවර්ධනයද අඩාල වේ.රටේ වෙසෙන ජනතාව විසින් ඉදිරිපත් කරනු ලබන අදහස් යෝජනා වලදී විසඳුම් ලබාදීමේදී මෘදු සිතකින් බලා විසඳුම් ලබාදීම පාලන පක්ෂයේ වගකීම වේ.එම යෝජනා ඉදිරිපත් කිරිමේ දී ජනතාවගේ සහායෝගයෙන් කටයුතු කල යුතු වේ.රාජ්‍ය පාලනය අවුල් සහගත තත්වයකට පත් නොවන අයුරින් සිදු කිරීම ජනතාව සතු වගකීම වනු ඇත.එවිට නිවැරදි වූත් කාලීන වූත් යහපත් ප්‍රතිඵල ලබා ගැනීමට අයුරින් ක්‍රියා කිරීමට ජනතාව සූදානම් විය යුතු ය. විවිධ මතිමතාන්තර දරණ ජන කොටසක් සිටින රාජ්‍යයක (රටක) අදහස් එකිනෙකට පටහැනිවෙයි. ඒවා නිවරණය කිරීමද අපහසු වේ.

යම් රටක ජීවත් වන ජනතාවගේ පාලන පක්ෂයන් පංච ශිල ප්‍රතිපත්තිය අනුගමනය කරන්නේ නම් එය රාජ්‍ය පාලනයටත් ජනතාවගේ සුභසිද්ධියටත් හේතුවේ. පංචශීල ප්‍රතිපත්තියට ජාති, ආගම්, කුල, ග්‍රෝත්‍ර භේදයන් නොමැත. පොදුවේ ජනතාවගේ සදාචාර සංවර්ධනයත් ආර්ථික සංවර්ධනයත් එමගින් ඇති කරවයි.

නිරෝගිමත් සංවරශිලි ජනතාවක් වෙසෙන රටක් බවට පත්වනු ඇත. ලිච්ඡවී රජදරුවන්ට බුදුරජාණන් වහන්සේ වදාළේ සප්ත අපරිහානීය ධර්ම ආරක්ෂා කරන ලෙසයි. එවිට කිසිවෙකුටත් රාජ්‍යය යටපත් කිරීමට නොහැකිවන බවට පෙන්වා දී තිබෙන්නේ ලිච්ඡවී රජදරුවන්ට දේශනාකලත් ඕනෑම ජන කොටසක් සඳහාම එම කරුණු අදාළ කරගැනීමට හැකිවේ. එහි සඳහන් වන සමගිව රැස්වීම, සමගිව විසිරයෑම යන කරුණු දෙක ජන සමාජයකට ඉතා



තිබිය යුතු ය.මෙයට අමතරව රාජ්‍යයතුල ජීවත්වන ජනතාවගේ ජීවනෝපායන් පවත්වාගෙන යෑම සඳහා ආර්ථික වශයෙන් උදව් උපකාර කලයුතු ය.එවිට පුද්ගල සංවර්ධනය සිදුවෙන අතර එය රටත් සමාජයත් ස්වයංපෝෂිත වන්නට ඉවහල්වේ. ජනතාවගේ යහපත උදෙසා සිදුකරනු ලබන සුභ සාධක සේවාවන් ද දානය සංඛ්‍යාවට අයත් වේ.

සීලය ද රටේ පැවැත්මට ඉවහල් වන ප්‍රධාන කරුණක් වන බව බෞද්ධ දර්ශනයේහි දක්වා තිබේ.රාජ්‍ය පාලකයා ප්‍රධාන රාජ්‍ය යන්ත්‍රනයට සීලයෙහි පිහිටා කටයුතු කිරීම මෙයින් අදහස් කෙරේ.රාජ්‍ය පාලනය කරන පිරිස අනුගමනය කිරීම ජනතාවගේ ස්වාභාවයයි.පාලක පිරිස් නිවැරදි මාවතක ගමන් කරයි නම් ජනතාවත් එලෙස ක්‍රියා කරනු ඇත.එයින් මඟ හැරෙන්නේ ඉතා සුළු පිරිසක් විය හැකිය.

චාරිත්‍ර වාරිත්‍රයන්ද අනුගමනය කිරීමත් ශිලයෙහි එක්කොටසක් වේ.රටක වෙසෙන ජනතාව එයට අනුග්‍රහ හැකිවනු ඇත.ජනතාවගේ ස්වාභවය සතුට වන ලෙස ජීවිතයක් ගත කිරීමට කැමති වීමයි.ඒ සඳහා අවශ්‍ය වන සම්පත් සපයා ගැනීමට අවශ්‍ය උදව් ලබා ගැනීම රාජ්‍ය පාලනයෙන් අපේක්ෂා කෙරේ.එසේ නොවුනහොත් පාලන පක්ෂය කෙරෙහි ජනතාව ද්වේෂ සහගත ලෙස බලනු ඇත.එවැනි අවස්ථාවල දී පාලක පිරිස් ක්‍රියාකල යුත්තේ ජනතාව කෙරෙහි ක්‍රෝධ සිතකින් නොවේ. වැදගත් වූ සාධාරණ සිතකින් ඒ සඳහා තීරණ ගත යුතු වේ.

ක්ෂණික තීරණ මගින් ප්‍රශ්න විසඳීමට යෑම අවුල් සහගත තත්වයක් ඇති කරයි.තීරණ ගැනීමට පෙර ජනතාව දැනුවත් කිරීම ඉතා වැදගත්ය.එවිට ජනතාව අවබෝධය තුලින් පාලන පක්ෂයේ තීරණවලට එකඟවනු ඇත.රාජ්‍ය පාලන කටයුතු වලට බාධා පමුණුවන අදහසින් කටයුතු කිරීම යහපත් ජනතාවගේ වගකීම නොවනනේ ය.

රාජ්‍ය පාලන කටයුතුවලට බාධා නොවන වැදගත් බව පෙන්වාදීමට පුළුවන.එම කරුණු අනුගමනය කිරීමෙන් ජනතා ගැටළුවලින් හා ආරවුල් වලින් තොර සාමකාමී ජන සමාජයත් නිරායාසයෙන්ම ඇති වේ.ජනතා අපේක්ෂාවන්ද ඉටුවනු ඇත.

ඉහත සඳහන් දසරාජ ධර්මයන්ද,සප්ත අපරිහානිය කරුණු ද ජන ජිවිතය සම්බන්ධ කරගැනීම යහපත් ජනසමාජයක් වෙසෙන රටක් බවට පත්කරගත හැකිවන බව නොඅනුමානය. එවැනි ජනතාවක් වෙසෙන රටක පාලන කටයුතු ද ඉතා සාර්ථක අයුරෙන් පවත්වාගෙන යෑමට හැකිවනු ඇත යන්න බෞද්ධ දර්ශනයට අදාලව පෙන්වා දිය හැකිය.

**විජයවර්ධන තලවත්තේගෙදර**



# මෛත්‍රීය වැඩීමෙන් මෙලොව පරලොව සැප ලැබිය හැකිය

බුදුරාජාණන් වහන්සේ, මෛත්‍රිය වැඩීම ආරම්භකර ඇත්තේ බෝධිසත්ව කාලයේ සිටය. ඒ බව සාම ජාතක කථාවෙන් මැනවින් පැහැදිලි වෙයි. එයින් පැහැදිලි වන්නේ, බුදු බව ලබාගැනිම සඳහා මූලික කරුණක් ලෙස මෛත්‍රිය හේතුවන බවයි. අධ්‍යාත්මික සංවර්ධනයේ ආරම්භක අවස්ථාව වශයෙන් ද මෛත්‍රිය පෙන්වාදිය හැකිය. ලෝකයේ ජීවත්වන මිනිස් වර්ගයා තුළ ලෝභය, ද්වේෂය, මෝහය, ඊර්ෂ්‍යාව, මානය, යන සිත කිලිටි කරන සිතුවිලි නිරායාසයෙන්ම උපදී. එයට ප්‍රධාන හේතුව වන්නේ ලෝකයේ පවතින විෂමචාරි ස්වාභාවයයි. සම්බුද්ධ ශාසනයේ වෙසෙන සිව්වනක් පිරිසට බුදුරාජාණන් වහන්සේ පෙන්වා දී ඇත්තේ ලොව වෙසෙන සියළුම සතුන්ට මෛත්‍රිය කරන ලෙසට ය. බුදුරාජාණන් වහන්සේගෙන් කමටහන් ලබාගත් භික්ෂු පිරිසක් වනාන්තරයට ගොස්, වෘක්ෂමූලවල වැඩ සිටිමින් භාවනා කරන්නට පටන් ගත්හ. මේ අවස්ථාවේ වෘක්ෂයන්ට අධිපති දෙවිවරු විවිධ විකාර රූපයන් මවාපාමින් භික්ෂූන් වහන්සේලාගේ සිතට බිය ඇති කලහ. බියට පත් භික්ෂූන් වහන්සේලා භාවනාව නතරකර ආපසු ආරාමකරා ගියහ. මෙම සිදුවීම බුදුරාජාණන් වහන්සේට සැලකර සිටියාහ.

මෙම අවස්ථාවේ සිදු වී ඇත්තේ කුමක්දැයි අවබෝධ කරගත් බුදුරාජාණන් වහන්සේ ලොව වෙසෙන සියළුම සතුන්ට මෛත්‍රිය කිරීම සඳහා කරණීය මෙත්ත සූත්‍රය දේශනා කළ සේක. ''සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා'' සියළුම සත්වයෝ සුවපත් වෙත්වා පරම ප්‍රාර්ථනයයි. එයින් ගම්‍ය වන්නේ කරණීය මෙත්ත සූත්‍රය ඉගෙනගත් භික්ෂූන් වහන්සේලා නැවත වනාන්තරයට ගොස් භාවනාකර (කරණීය මෙත්ත සූත්‍රය පෙන්වා දුන් පරිදි ) රහත් භාවයට පත් වූ බව දේශනාවේ සඳහන් වෙයි. මෙම කරණිය මෙත්ත සූත්‍රය අනුගමනය කිරීමට පියවර කිහිපයක් දක්වා තිබේ. පළමු පියවර වන්නේ යෝගාවචරයා සතිය කෙරෙහි පිහිටා සිටීමය. දෙවන අවස්ථාව වන්නේ මෛත්‍රී භාවනාවේ දැක්වෙන කරුණු අධ්‍යනය කිරීමය. තුන්වන අවස්ථාව වන්නේ සියළුම සතුන් කෙරෙහි අවධානය යොමු කිරීමයි. හතරවන අවස්ථාව වන්නේ භාවනාවට යෝග්‍ය පරිසරය සකස්කර ගැනීමය. පස්වන අවස්ථාව වන්නේ, මෛත්‍රිය පිදිය යුතු තැනැත්තන් වෙන් වශයෙන් හඳුනා ගැනීමය. මෛත්‍රී භාවනාවේ ඇති අනුසස් අවබෝධ කරගැනීම ඊළඟ අවස්ථාවයි. මෛත්‍රී භාවනාව ගැන, විස්තර සූත්‍රයක් වන්නේ මජ්ඣිම නිකායේ සඳහන් වන 'කක්ඛූපම සූත්‍රයයි'. තමන්ට විරුද්ධව එන පුද්ගලයන්ට එරෙහි නොවී මෛත්‍රිය දැක්වීම මෙම සූත්‍රයෙන් පෙන්වා දෙන අර්ථයයි. භාවනාවේ ආනිශංස එකොලහක් අංගුත්තර නිකායේ මෛත්‍රී සූත්‍රයෙහි දක්වා තිබේ. එය මෙසේය.

01.සැප සේ නිදයි.

02.සැප සේ අවදි වෙයි.

03.බියකරු සිහින නොපෙනේ.

04.මනුෂ්‍යන්ට ප්‍රිය වේ.

05.අමනුෂ්‍යන්ටද ප්‍රිය වේ.

06.දෙවියන් විසින් ආරාක්ෂා කෙරේ.

07.ගිනි, සර්ප විෂ, ආයුධ වලින් හානි සිදු නොවේ.

08.සිත සාමාධි ගත වේ.

09.මුහුණ පැහැපත් වේ, වර්ණවත් වේ.

10.මනා සිහියෙන් යුක්තව කලුරිය කරයි.

11.මරණින් මතු අපාය ගාමී නොවී බඹලොව උපදී.

මෙවැනි අනුසස් ලබා දෙන මෛත්‍රී භාවනාව, ඕනෑම පුද්ගලයෙකුට වැඩිය හැකිය. භාවනාව සිදු කිරීමට අපේක්ෂා කරන යෝගාවචරයන් නිසල පරිසරයක් සොයාගත යුතුය. ඒ බව ''ආරඤ්ඤගතොවා රුක්ඛමූල ගතොවා සුඤ්ඤාගාර ගතොවා'' යනුවෙන් දක්වා තිබේ. වනාන්තරයක, ගස් යට ජනශූන්‍ය ප්‍රදේශයක භාවනාව සඳහා ඉතා යෝග්‍ය බව මෙත්ත සූත්‍රයෙහි දක්වා තිබේ. මෙම සූත්‍රයෙහි දක්වා ඇති පරිදි ප්‍රායෝගික වශයෙන් යොදාගත හැකි කරුණු රාශියකි. ඒවා අනුගමනය කිරීම නිවණට යොමුවීමක් ලෙසට සැලකිය හැකි බව දහමෙහි දක්වා තිබේ.

ඇතැම් පුද්ගලයන් කරණීය මෙත්ත සූත්‍රය හඬනඟා කියවීම සිදුකරනු ලබයි. එසේ කරන්නේ පිහිටක් අපේක්ෂාවෙන්ය. එය ප්‍රයෝජනයක් නොවන ක්‍රියාවන් බව අවබෝධ කරගත යුතුය. කරණීය මෙත්ත සූත්‍රයෙහි සඳහන්වන ආකාරය සියලුම සතුන් වෙන වෙනම සිහිකරමින් භාවනා කිරීම සිදුකළ යුතු වේ. ඒ සඳහා සිත සන්සුන් කරගෙන සුදානම් විය යුතුය. බුදුදහම ප්‍රායෝගිකව සිදුකළ යුතු දෙයක් මිස සජ්ජායනා කරන දහමක් නොවන බව බුද්ධිමත්ව අවබෝධ කරගත යුතුය. වර්තමාන ලෝකයේ සිදුවන මනුෂ්‍ය විනාශයන්ට මූලික හේතුව බලකාමිත්වයයි. මේ සඳහා කළ යුතු වන්නේ මිනිස් සිත් තුළම මෛත්‍රිය ඇතිවන වැඩ පිළවෙළක් ලොව පුරා ඇති කිරීමයි. මේ සඳහා බුදු දහමින් ලබාගත හැකි ප්‍රයෝජන විශාල ප්‍රමාණයක් පවතී. 'අත්ථානං උපමං කත්වා, නහණෙය්‍ය නඝාතයෙ' (තමා විනාශවීමට නොකැමැත්තේ කෙසේද එසේම අන්‍ය සත්වයින්ද, විනාශවීමට අකමැති බව අවබෝධ කරගත යුතුය.) මෙත් වැඩීම තුළින් ලෝක සත්වයාගේ සංසාර විමුක්තිය උදාවේවා යන ප්‍රාර්ථනය අප සැම සිත් තුළම ඇති වේවා.

විජය

# බිනර පොහොය සමග ඇරඹි මෙහෙණි සසුන

බුදු සසුන තුළ භික්ෂුණී ශාසනයේ ආරම්භය සිදුවූයේ බිනර පුර පසළොස්වක පොහොය දිනයේදීය. බිනර පොහොයට ශාසන ඉතිහාසය තුළ වැදගත් තැනක් හිමි වෙයි. මහාප්‍රජාපතී ගෝතමිය පැවිදි වීම එදින සිදු වූ වැදගත් කරුණකි. එය භික්ෂුණී ශාසනයේ ආරම්භය විය. එකල අප තිලෝගුරු බුදුපියාණන් වහන්සේ වැඩ සිටියේ කිඹුල්වත්පුර නිග්‍රෝධාරාමයේය. මහප්‍රජාපතී ගෝතමිය බුදුරජාණන් වහන්සේ කරා එළඹ වැද එකත් පසෙක සිට කාන්තාවනටද බුදුසසුන තුළ පැවිද්ද හා උපසම්පදව ලබාදෙන ලෙස තෙවරක්ම ඇයද සිටියාය. එසේම එම අවස්ථාව උචිත නොවන බව දන සිටි බුදුරජාණන් වහන්සේ එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ සේක. ස්වකීය ඉල්ලීම ඉටු නොවූ බැවින් මහාප්‍රජාපතී ගෝතමී දේවිය බුදුපියාණන්ට වැඳ, ප්‍රදක්ෂිණා කොට කණගාටුවෙන් යුතුව නිග්‍රෝධාරාමයෙන් නික්ම ගියාය.

බුදුපියාණන් වහන්සේ ඊළඟ වස් කාලය වැඩසිටියේ විශාලා මහනුවර මහවනයෙහි කූටාගාර ශාලා විහාරයේය. එහිදීද මහා ප්‍රජාපති ගෝතමී ශාක්‍ය කෝලීය දෙරට භාර්යාවන් පන්සියයක්ද කැටුව හිසකෙස් කපා, කසාවත් හැද පා ගමනින්ම බුදුරජාණන් වහන්සේ වෙත පැමිණියහ.

මෙම කාන්තා පිරිස බොහෝ දුරක්, එනම් පනස් එක් යොදුනක්ම පා ගමනින් පැමිණි බැවින් කායිකව වෙහෙසට පත්ව සිටියහ. කූටාගාරශාලා විහාරයට ලංවන විට ශරීරය දහදියෙන් තෙත්ව, දූවිල්ලෙන් ගැවසී දෙපා ඉදිමී දුර්වර්ණ වී පැවතුණි. තදබල ලෙස විඩාවට පත්ව සිටි බැවින් වෙහෙර තුළට ඇතුල්වීමට තරම් හැකියාවක් නොමැතිව ඔවුහු කූටාගර ශාලාවේ ප්‍රධාන දොරටුව අසළ රැඳී සිටියහ.

මෙලෙස දෙවැනිවරට පැවිදි වෙස් ගෙන, මනා සංවිධානයෙන් එලැඹියේ ඔවුන්ගේ යහපත් වූ අරමුණ හැකි ඉක්මනින්ම ඉෂ්ට කරවා ගැනීමේ ඒකායන පරමාර්ථයෙන් බව සක් සුදක්සේ පැහැදිළිය.

ඉක්බිතිව මහා ප්‍රජාපතී ගෝතමිය ආනන්ද හිමියන්ට කරුණු සැලකර සිටියාය.

ආනන්ද හිමියෝ බුදුරජාණන් වහන්සේ වෙත එලැඹ සියළු තොරතුරු දන්වා සිටියහ. එහිදීද එම ඉල්ලීම තෙවරක්ම බුදුපියාණෝ ප්‍රතික්ෂේප කළහ.

නමුත් ආනන්ද හිමියන්ගේ බලවත් උනන්දුව මත මහා ප්‍රජාපති ගෝතමිය ප්‍රමුඛ කාන්තා පිරිසට බුදු සසුනේ පැවිදි වීමට භාග්‍යඋදා විය. මහා ප්‍රජාපති ගෝතමිය අෂ්ට ගරු ධර්ම පිළිගන්නෙහි නම් එයම එතුමියගේ පැවිද්ද හා උපසම්පදව පිහිටීමට හේතුවන බව බුදුරජාණන් වහන්සේ ආනන්ද හිමියන්ට වදළහ.
එම අෂ්ට ගරු ධර්ම නම්,

1. උපසම්පදවෙන් වසර සියයක් ගතවූ මෙහෙණියක විසින් වූවද, එදින උපසම්පදවූ භික්ෂුව දක වැඳුම්, හුනස්නෙන් නැගී සිටිම් ආදී ගෞරව කළ යුතුය.

2. භික්ෂුණිය තමාට අවවාද ලබා ගැනීමට සුදුසු භික්ෂුවක නොමැති ප්‍රදේශයක වූ මෙහෙණවරක වස් නොවිසිය යුතුය.

3. අඩ මසක් පාසා මෙහෙණිය විසින් භික්ෂු සංඝයාගේ පොහොය විචාල යුතුය. අවවාද දීමට භික්ෂුවකගේ පැමිණීමද බලාපොරොත්තු විය යුතුය.

4. වස් විසූ භික්ෂුණිය වස් අවසානයේදී භික්ෂු භික්ෂුණී යන උභතෝ සංඝයා ඉදිරියේ වස් පවාරණය කළ යුතුය.

5. බර ඇවතකට පත් භික්ෂුණිය, දෙසතියකට නොඅඩු කාලයක් උභතෝ සංඝයා ඉදිරියේ වත් මානත් පිරිය යුතුය.



6. උපසම්පදාව ලබනු කැමති මෙහෙණිය අවුරුද්දකට ශික්ෂ මානාවකව (පුහුණුවන්තියකව) මෙහෙණින් ළඟ විසිය යුතුය.

7. කවර කරුණක් නිසාවත් භික්ෂුණියක විසින් භික්ෂුවකට ආක්‍රෝශ පරිභව නොකළ යුතුය.

8. භික්ෂුණිය විසින් භික්ෂූන්ට අවවාද නොකළ යුතුය. භික්ෂූන්ගේ අවවාද, අනුශාසනා පිළිගත යුතුය.

මෙම ගරු ධර්ම අට බුදුරජාණන්වහන්සේ වෙතින් අසා දනගත් ආනන්ද හිමියෝ මහා ප්‍රජාපතී ගෝතමිය වෙත පැමිණ විස්තර කර දුන්හ.

එය ඇසූ එතුමිය මෙම අෂ්ට ගරු ධර්ම ජීවිතාන්තය දක්වාම කඩ නොකර ආරක්ෂා කරන බවට ප්‍රතිඥා දුන්නාය. ඉක්බිතිව ආනන්ද හිමියෝ බුදුරජාණන්වහන්සේ වෙත එළඹ මහා ප්‍රජාපති ගෝතමිය අෂ්ට ගරු ධර්ම පිළිගැනීමෙන් පැවිදි උපසම්පදව ලැබූ බව ප්‍රකාශ කළහ.

අද වැනි බිනරපුර පසළොස්වක පොහොය දිනෙක මහා ප්‍රජාපතී ගෝතමිය පැවිදි උපසම්පදව ලැබූවේ එසේය. ඉන්පසුව අනෙක් කාන්තා පිරිසද එතුමිය අනුව යමින් පැවිදි උපසම්පදාව ලැබුහ.

මෙලෙස මෙහෙණි සසුන ආරම්භ කිරීම පිළිබඳ වූ බලාපොරොත්තුව ඉටුවී පැවිදි උපසම්පදව ලබා ගත් මහා ප්‍රජාපතී ගෝතමිය බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ වැඳ එකත්පසෙක සිටියාය. උන්වහන්සේ එතුමියට ධර්මය දේශනා කළසේක. ධර්මාවබෝධය ලබාගත් එතුමිය භාවනා ඉගෙන විදසුන් වඩා රහත් වූවාය.

ඉන්පසුව යශෝදරා දේවිය ඇතුළු කාන්තාවෝ රැසක් එතුමිය වෙත පැමිණ පැවිදි වූහ. පසු කලෙක බුදුරජාණන්වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වෙසෙමින් මෙහෙණින් වහන්සේලා උචිත තනතුරෙහි පිහිටවන සේක්, මහා ප්‍රජාපතී ගෝතමියට චිරරාත්‍රඥ හෙවත් පැවිදිව බොහෝ කල් වූ භික්ෂුණීන් අතුරෙන් අග්‍ර ස්ථානය පිරිනැමූහ.

බිනර පුර පසළොස්වක පොහෝ දිනය මෙහෙණි සසුන ආරම්භකොට කාන්තා පරපුරට උභයාර්ථ සංසිද්ධිය සලසා ගැනීමට මඟ පෑදූ වස් සමයේ ඉතාම වැදගත් පොහොය දිනයක් බව අවබෝධකරගත යුතුය. මෙම කාලය තුළදී ශාසනික ප්‍රතිපදවන්හි නිරත වෙමින් මෙලොව පරලොව උභයාර්ථ සංසිද්ධිය සලසා ගැනීමට ගිහි පැවිදි දෙපිරිසම වඩාත් උත්සුක විය යුතුය.

**මෙත්තානි අසේකා මෙහෙණින්වහන්සේ**



# රහතන් වහන්සේ

**රහත්** බව බුදු සසුනේ ශ්‍රාවක සංඝයාට ලද හැකි ශ්‍රේෂ්ඨතම පදවියයි. ලෝභ, ද්වේශ ආදී සියළුම ක්ලේශ කර්මයන් නාසා නිවන් අත් පත් කර ගත් උත්තමයන්ට 'අරහ' යන නාමය ව්‍යවහාර කර ඇත. සියළු කෙලසුන් නැසූ බව, සියළු පූජාවන්ට සුදුසු බව, සංසාර චක්‍රයාගේ අර සිඳලූ බව, රහසින්වත් පව් නොකළ යුතු බව 'අරහ' යන්නෙන් ප්‍රකාශ වේ. ඒ බව මෙසේ සඳහන්කළ හැකිය.

''ආරකතනා හතතතාව කිලෙසාරීන සො මුනී
හත සංසාර චකකාරො පචචයාදීන චා රහො
න රහො කරොති පාපානී අරහනෙතන පවුචචතී"

බුදු රජාණන් වහන්සේ අරහං නම් බුදු ගුණය විග්‍රහ කිරීමට ඉහත ගාථා පාඨය යොදා ගෙන ඇත්තේ ඉන් රහතන් වහන්සේගේ ස්වභාවය අපට හඳුනාගත හැකි වීමටය.

රහතන් වහන්සේ පළිබඳව කරුණු සොයා බලන විට උන් වහන්සේ හැඳින් වීමට යෙදූ විශේෂ පර්යාය නාමයන් රාශියක් හමු වේ. එම විශේෂ නාමයන් විමසා බලන විට උන් වහනසේගේ ගති ලකෂණ හා ස්වභාවය කෙබඳු දැයි වටහා ගන්නට පිළිවන. මෙම පර්යාය නාමයන් සකස් වී ඇත්තේ රහතන් වහන්සේගේ ස්වභාවයනට අනුවය. එබැවින් අප මූලික වන එම විශේෂ නාමයන් කෙරෙහි අවධානය යොමු කරමු.

''ඛීණාජාතී වුසිතං බ්‍රහමචරියං කතංකරණීයං
නා පරං ඉතථතථායතී.."

ජාතිය හෙවත් ඉපදීම කෂය කරන ලදි. වැස නිම වන ලද බ්‍රහ්මචර්යාව ඇත්තේ වෙයි. කලයුතු සියල්ල කොට නිම වන ලදි. එබැවින් යළි කළ යුතු කිසිවක් නැත. එබැවින් යළි උපතක් ද නැත්තේය."

මෙය රහතන් වහන්සේගේ මූලික ලකෂණායයි. සෝවාන් ආදී මාර්ග පල ක්‍රමයෙන් වඩාගනිමින් උන් වහන්සේ සසර සමඟ ඇති සබඳතා ලිහා දමා ඇති බැවින් යළිදු බවයේ උපතක් නොමැත. සසර ගමන සංසිඳුවා ඇති බව මෙයින් පැහැදිලි වේ.

තවත් තැනකදී රහතන් වහන්සේ සනතින්ද්‍රිය" නමින් හඳුන්වයි. දමන කළ ඉඳුරන් ඇති බව ඉන් අර්ථ ගැන්වේ. ඇස කණ නාසය ආදි පංචේන්ද්‍රයන් පිනවීමත් උන් වහන්සේට නැත. එම ඉඳුරන් දමන කොට ඇත. සියළු ඇලීම් හා ආශාවන් ප්‍රහීන කළ හෙයින් වීතරාගී" වූහ. යළි හික්මෙන්නට දෙයක් නොමැති හෙයින් හික්මීමේ සංවර බවේ අග්‍රස්ථානයට පැමිණි හෙයින් රහතන් වහන්සේ අසංඛෙ"ය වේ. තවත් තැනකදි උන් වහන්සේ මහිතභාර" යන නාමයෙන් හඳූන්වයි. ඒ අරුථ සියළු කෙලෙස් බර බහා තැබූ යන්නනයි. පුහුදුන් පුද්ගලයා සසර සැරි සරන්නේ කෙලෙස් බර කර තබාගෙන ඇති බැවිනි. රහතන් වහන්සේ එසේ නොවේ. සියළු කෙලෙස් බර බිම තබා ඇත. එබැවින් උන් වහන්සේට සසර පිළිබඳ බරක් ද නැත. ද්වේශය ප්‍රහාණය කළ බැවින් වීතදෝසි" නමින් ද මෝහය නැති කළ බැවින් වීතමෝහි" නමින් ද උන් වහන්සේ හඳුන්වා ඇත. තවත් අවස්ථාවක රහතුන් පාරගූ" නමින් හැඳින් වේ. එහි අරුත නම් "පරතෙරට" ගිය යන්නයි. සසර ගමනෙහි කෙළවරට ගිය උන් වහන්සේට යළි තරණය කරන්නට හෝ එතර වන්නට යමක් නැත. එබැවින් සියල්ලෙහිම පරතෙරට ගිය උන් වහන්සේ පාරගූ" නම් වේ. සියළු කෙලෙස් මුල් ගලවා විනාශ කළ හෙයින් උච්ඡින්න මූළහ" නම් වේ. උත්සාහයෙන් සසර කෙළවර සොයා ගත් බැවින් ගතද්ධි" නම් වේ. බුදු රජාණන් වහන්සේ දේශනා කළ මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කොට නිවන් සුවය ලබන්නට අධිෂ්ඨානය හා උත්සාහය තිබිය යුතුය. දැඩි උත්සාහය සහ දැඩි අධිෂ්ඨානයෙන් යුතුව සසර කෙළවරට ගිය බැවින් එතුමන් වහන්සේ "ගතද්ධි" නමින් ද සියල්ලෙන් මිදුන නිසා "විමුතෙකා" නමින් ද රාගාධි ගිනි වලින් මිදී නිවීමට පත් වූ බැවින් "සනෙතා" නමින් ද හදුන්වනු ලැබේ.

මේ ආදී විවිධාකාර විශේෂ සංඥා නාමයන්ගෙන් උන් වහන්සේගේ ස්වභාවයන් වටහා ගැනීමට අපිට හැකියාව තිබේ.

''සබබාසව පරිකඛීණො
නතථිදානි පුනබභවො.."

සියළු ආශ්‍රව ධර්මයන්ගෙන් කෂය කර බැවින් මතු නැවත ඉපදීමක් නැත. නැවත සසරෙහි යමෙක් උපත ලබන්නේ නම් හෙතෙම ආශ්‍රම ප්‍රහීණ කොට විනාශ කොට නැත. එබැවින් ඔහුට පුනර්භවයක් ඇත. රහතන් වහන්සේට එබඳු පුනර්භවයක් නොමැත. ."

ඉන්ද්‍රියෙසු ගුතතදවාරො හොති

රහතන් වහන්සේ වැසූ ඉන්ද්‍රිය දොරටු ඇත්තේය. උන් වහන්සේ කණින් සියල්ල අසයි. ඇසින් රූපයන් දකී. නමුත් ප්‍රාඥවූ එතුමන් ඇසූ දුටු සියළුම දේ කෙරෙහි උපේක්ෂා සහිතව කිසිවක් ඉන් බැහැර කරනට හෝ ගන්නට උන් වහන්සේට අවශ්‍යතාවයක් නොවෙයි. එම අරමුණු කෙරෙහි උන් වහන්සේ මැදහත්ය. එක් අවස්ථාවක මහා කච්ඡාන තෙරුන් වහන්සේ මෙසේ ප්‍රකාශ කරයි. ශබ්ද ඇසීමෙන් ගොළුවෙකු මෙන් ද, රූප දැකීමෙන් අන්දයකු මෙන් ද, නොගැලපෙන දෙයහි 'මළ' අයකු ලෙසද කටයුතු කරන බවය. එපමණක් නොව ඒ උතුමන් වහන්සේලා ආකාසෙව සකුනතානං..." අහසෙහි පියාසර කරන පක්ෂීන් මෙනි. පක්ෂියෙකුට ඇත්තේ පියාපත් වල බර පමණි. එමෙන්ම රහතන් වහන්සේට ඇත්තේ පා සිවුරු බර පමණකි. එබැවින් කැමති තැනකට වැඩම කරන්නට තරමේ නිදහස් බවක් සැහැල්ලු බවක් රහත් උතුමන්ට ඇත. එපමණක් නොව පියාඹා ගිය පක්ෂීන්ගේ පා සළකුණු නොරදන්නාක් මෙන් රහතන් වහන්සේ පිරිනි වී පසු යළි ඉපදුමක් ද නැත.


රහතන් වහන්සේ කිසිම විටෙක තෘෂ්ණා දුෂ්ඨි වශයෙන් ඇලීමක් ඇති කර නොගන්න බැවින් උන් වහන්සේගේ හිත ඉතා ප්‍රසන්නය. ඒ බව ධම්ම පදයේ 'රහදොව අපෙත කදදමො.." යනුවෙන් දක්වයි. මඬ පහ වූ විලෙක නිල් දියෙන් පිරී ගිය පසු ඇති ප්‍රසන්න බව පිරිසිදු බව මෙන් රහතන් වහන්සේගේ හිත ද පිරිසිදුය. එහි තෘෂ්ණාව, මාන, දුෂ්ඨි කිසිවක් නැත. සියළු ආශාවන් වමාරා ඇති හෙයින් උන් වහන්සේට කිසිම අයුරකින් 'පරිලාහො න විජජති.." දැවීමක් ඇත්තේ නොවේ. සියළු කෙලෙස් ගිනි නිවා දමා කොට ඇත. සංසිදී ගිය සිතක් සහ සංසිදී ගිය පැවැතුම් උන් වහන්සේට ඇත.

රහතන් වහන්සේගේ ජීවිත පැවැත්ම පද්මාකාරය. විලෙක හටගත් නෙලුමක් මඬෙහි නොගැවී ජලයෙන් උඩට මතුව ජලයෙහිද නොගැවී නොගැටී සිටී. එලෙසින් රහත් උතුමන්ද සමාජයෙන්ම බිහිවී සමාජය නමැති ජලයේ නොගැටී ඉන් බිදී ප්‍රභාවත්ව වාසය කරයි. ලකෂණ එබදු වුවද උන් වහන්සේ සෞන්දර්ය සංකල්පය අගේ කොට ඇත. රමණීය වන ලැහැබ ඉතා සිත් ගන්නා සුළු බව ප්‍රකාශ කොට ඇත. 'තං භූමිං රාමණෙය්‍යකං" යන ධම්ම පද පාඨයට අනුව සිතින් සුන්දරවත් වූ අයෙකු වසන භූමි භාගය රම්‍ය භූමියක් වන බව පැහැදිලි වේ. එක් අවස්ථාවක 'භූත' නම් තෙරණුවෝ තම සිත 'මලින් ගැවසී ගත් උයනක් සේ' දකියි. මෙසේ දකින උන් වහන්සේ ධ්‍යාන වඩමින් සුවසේ වාසය කරයි. තවත් වරෙක 'කළුදායි' තෙරුන් බුදු රජාණන් වහන්සේ ඉදිරියේ කළ කිඹුල්වත් පුර දක්වා වූ මඟ වැනුමේ දී 'නා දළු පත් වලින් හෙබි වෘකෂයන් පහන් සිළු මෙන් බබළන බවත් කිඹුල්වත් පුරයට වැඩීමට කාලය එළඹ ඇති බවත්' ප්‍රකාශ කරයි. මේ අනුව පෙනී යන්නේ ක්ලේෂ ධර්මයන් ප්‍රහීනය කළ මහ රහතන් වහන්සේත් සෞන්දර්ය අගය කළ බවයි.

රහතන් වහන්සේගේ ස්වභාවය අප දැන් අධ්‍යයනය කළෙමු. එම අධ්‍යයනය කළේ අප උන් වහන්සේලා විෂයෙහි වූ විශේෂ නාමයන් කිහිපයක් විමසීමෙනි. ඒ අනුව එතුමන්ලා දැමුණු සංසිඳුනු උත්තම ජීවන පැවැත්මක් ඇති නිදහස අගය කළ හැකි කාම ලෝකය හා නොගැටී පුහුදුන් පුද්ගලයා කෙරෙහි කරුණාවෙන් හා හිතවාදී ව වාසය කරන බව පැහැදිලිය. උන් වහන්සේ විෂයෙහි අප නොදැනගත් කරුණු අල්ප වුවද විමසිය යුතු, අධ්‍යයනය කළ යුතු ගුණ විශේෂ බොහෝමයක් වේ.

පූජ්‍ය එම්.සිරිධම්මචාරි මෙහෙණින් වහන්සේ

# උපයන ධනය නිවැරදිව පරිහරණය කළ යුත්තේ කෙසේද?



බුදු සමය ලෝකයේ වෙනත් බොහෝ ආගම් අතරින් විශේෂත්වයට පත් වන්නේ එය ආගමක් දර්ශනයක් මෙන්ම ජීවන මාර්ගයක් ලෙසද සැලකිය හැකි බැවිනි. ඇදහීමට යෝග්‍ය වන හෙයින් ආගමක් වශයෙන් දාර්ශනික වූ ඉගැන්වීම් සමුදායක් දක්වන බැවින් දර්ශනයක් ලෙසිනුත් විග්‍රහ කළ හැකි අතර ජීවන මාර්ගයක් වන්නේ ජීවත් වීමට යෝග්‍ය නියම මඟ එයින් ප්‍රකාශ වන හෙයිනි.

මුළු මහත් සත්ව වර්ගයාටම ජීවිතය පවත්වාගෙන යාම පිණිස අනිවාර්ය වූ මූලික අවශ්‍යතා තිබේ. මිනිසාටද මෙබඳු අවශ්‍යතා කිහිපයකි. භික්ෂූන් වහන්සේලා සම්බන්ධ කොට දේශනා කළ චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස යන සිව් පසය ඕනෑම මිනිසකුට වුවද යහපත් සමාජ ජීවිතයක් ගෙවීමේදී තිබිය යුතුමය. එම වුවමනාවන් සපුරා ගැනීමට මිනිසාට හැකි වන්නේ ධනයක් තිබීමෙනි.

ධාර්මික ධනය ඉපයීමේ ක්‍රම ලෙස බුදුරජාණන් වහන්සේ පෙන්වා දී ඇත්තේ ගොවිතැන, වෙළඳාම, ගව පාලනය හා රාජ්‍ය සේවයයි. වෙළඳාම අයුතු සේ ලාභ උපයන්නත් නොවිය යුතුවාක් මෙන්ම ගවයන් පාලනය කළේ ඔවුන්ගෙන් ලබා ගන්නා පස්ගෝ රසය පිණිස මිස මස් පිණිස නොවේ.

''ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය
ද්වීහි කම්මං පයෝජයේ
චතුත්ථංච නිධාපෙය්‍ය
ආපදාසු භවිස්සති''

මේ අයුරින් උපයා ගන්නා ධනය වැය කිරීම බුදුරජාණන් වහන්සේ අනු දැන වදාළ ක්‍රමයයි. සිඟාලෝවාද සූත්‍රයේ පෙන්වා ඇති මෙම ධනය පරිහරණය කිරීමේ ක්‍රමය අනුගමනය නොකිරීම නිසා අද අප මුහුණ පා ඇති ගැටළු රාශියකි. ලබන ධනය පරිභෝජනයත්, තැන්පත් කිරීමත් ස්වකීය කර්මාන්ත කටයුතුවලට යෙදවීමත් කළයුතු වේ. ''ධනං දානාය භුත්තයේ'' යන බුදු වදනට අනුව ධනය පරිභෝජනය පිණිසත් අන්‍යයන් වෙනුවෙන් පරිත්‍යාග කිරීමත් උදෙසා විය යුතුය. වර්තමාන සමාජය උදාහරණයට ගතහොත් විශාල කර්මාන්ත ආයතනයක උපයන ධනය සේවකයින්ට ලබාදීමක් නොමැතිව ආදායම මුළුමනින්ම අධිපතිවරයා සතු කර ගැනිම දීමකින් තොරව භුක්ති විඳීමකි. එවැනි පිළිවෙතක් ඇති තැනක් වෙතොත් එය ඉක්මනින් පිරිහීයයි.

එසේම අන්‍යයන්ට නොදී තමන්ම පරිභෝජනය කිරීම පිරිහීමේ මගකි. පරාභව සූත්‍රයේ එය පෙන්වා ඇත්තේ මෙසේයි.

''පහුත වින්තො පුරිසෝ
සහි රඤ්ඤෙ සභෝජනො
එකො භුඤ්ජති සාදුනි
තං පරාභව තො මුඛං''

බෞද්ධයකු ලෙස ධනය පරිහරණය කරන තැනැත්තා දීම, පරිභෝජනය, තැන්පත් කිරීම, යන සියල්ල අනුගමනය කරයි නම් ඔහු මනා සමාජ ජීවිතයක් ගත කරන අයෙකි.

අංගුත්තර නිකායේ චතුක්ඛ නිපාතයේදී සම්පත් නිසි සේ උපයෝගී කරගනිමින් ආර්ථික සුරක්ෂිතබව ඇති කර ගත හැකි අන්දම පැහැදිලි කර තිබේ. එහිදී ධනය යෙදවීමෙන් මාපිය පෝෂණය, විපත් වලදී වැය කිරීම, පරලොව යහපත පිණිස දක්ෂිණා දීම, තම ආහාර පාන වෙනුවෙන් යොදා ගැනීම ආදී කරුණු විස්තර කරයි. මව්පියන් පෝෂණය කිරීම දූ දරුවන් සතු පරම යුතුකමකි. සමාජය තුළ එබඳු දූ දරුවන් ගරු බුහුමන් ලබන්නවුන් බවට පත් වනුනේද නිරායාසයෙනි. ඇතැම් විට මහා ධන කුවේරයන්ව සිටින්නවුන් මව්පියන්ගේ සැප විහරණයක් ගැන නොසිතා ක්‍රියාකරන අවස්ථා අපට දකිය හැකිය. මෙය බෞද්ධයන් වශයෙන් අපහැම කණගාටු විය යුතු කරුණකි.

දෙගුරුන්ගේ ආශිර්වාදයකින් තොරව දරුවකුට දියුණුවක් ලැබිය හැකි නොවේ. ගුණ යහපත් සමාජයක් බිහිවන්නේද මනා දූ දරු හා දෙමාපිය සබඳතාවය තුළිනි. මේ අවස්ථා ළඟාවීම පිණිසද ධනය නිසිසේ පරිහරණය කිරීම හේතුවක් වේ.

ව්‍යග්ගපජ්ජ සූත්‍රයේදී පුද්ගලයෙකුගේ මෙලොව යහපතට හේතුවන කරුණු හතරක් බුදුරජාණන් වහන්සේ දේශනා කරති. එනම්,

ආරක්ඛ සම්පදා
උට්ඨාන සම්පදා
කල්‍යාණ මිත්තතා
සම ජීවිකතා

යන කරුණු සතරයි. මෙයින් ආරක්ඛ සම්පදාව ලෙස සැලකෙන්නේ උට්ඨාන වීර්යයෙන් යුතුව උපයාගත් ධනය රැක ගැනීමයි. වත්මන් ජන ජීවිතයේදී ධන විනාශයට බලපාන හේතු කොතෙකුත් තිබේ. ව්‍යග්ගපජ්ජ සූත්‍රයම දක්වා ඇති ආකාරයට ධන විනාශයට හේතුවන ප්‍රධාන කරුණු හතරකි.

ඉත්ථි ධුත්තො (ස්ත්‍රීන්ට ලොල්වීම)
සුරා ධුත්තො (සුරාවට ලොල්වීම)
අක්ඛ ධුත්තො (සූදුවට ලොල්වීම)
පාප මිත්ත සේවනා (පාප මිත්‍ර සේවනය)

තම තමන්ට අවංකව සිතට එකඟව යමක් තීරණය කරගැනීමේ අයිතිය බෞද්ධයකු සතුය. පවිටු මිතුරන් ඇසුරෙන් සුරාවට සූදුවට ලොල්වන ඇතැම් අනුවණ පුද්ගලයන් බෞද්ධකම පමණක් නොව මිනිස්කම පවා අහිමි කරගන්නා බව නොරහසකි. සමාජ ජීවිතයේ දී පුද්ගලයන් අතර ඇති උසස් පහත් භේද තීරණය වන්නේ මේ ක්‍රියාදාමයන් අනුගමනය කිරීම හා නොකිරීම අනුවයි.

බෞද්ධ සමාජයක එබඳු වැරදි ජීවිත ගත කරන්නවුන් උසස් ලෙස සැලකීමේ සිරිතක් නැත. එහෙත් අද අප ජීවත්වන සමාජය දෙස බලනවිට පෙනී යන්නේ මේ ධන විනාශයට හේතුවන ක්‍රියාමාර්ග සියල්ලම මිනිසා අතර සුලභ බවයි. සුරාව බෞද්ධ සමාජයේ පිටුදැකිය යුතු දෙයක් වුවත් සුරා නිෂ්පාදනය හා අලෙවිය රජයට විශාල ආදායමක් ලැබෙන මඟකි. අපේම සන්නිවේදන මාර්ග වලින් මත්ද්‍රව්‍ය භාවිත කළවුන්ගේ රැඟුම් ප්‍රදර්ශනය කරන්නේ සෙස්සන්ද ඒ සඳහා පොළඹවා ගන්නා අයුරිනි. සූදු ක්‍රීඩාවේ තත්වයද එසේමය. නිවැරදි අයුරින් කම්සුව විඳීම බුදු දහමේ ප්‍රතික්ෂේප කරන්නක් නොවේ. එහෙත් වැරදි ලෙස තම ආශාවන් ඉටුකර ගැනීමට යාම බෞද්ධකමට පටහැනිය. සමාජයෙන් බැහැරවිය යුතුදේ මිනිසුන් අතර ජනප්‍රිය කරවීමට ඉඩදීම බෞද්ධකම මෙන්ම මිනිස්කමද පිරිහීයාමකි.

ආගමික පසුබිමක් තුළ වැඩුණු පුරවැසියන් පිරිසක් ඇතිවීම ගුණගරුක සමාජයක් ගොඩනැගීමට හේතුවේ. එහෙත් සිදුවී ඇත්තේ පුද්ගලයා උපයන ධනය විනාශ කෙරෙන මාර්ග පිළිබඳව පුන පුනා අගය කිරීමකි. ආර්ථික වශයෙන් හිමිවන ලාභයන් සලකා ජනතාවගේ ආර්ථික සුරක්ෂිතභාවයට අවහිර වනදේ කිරීම ඥාණවන්තයන්ගේ ක්‍රමයක් නොවේ.

ජන සන්නිවේදන මාධ්‍ය වලින් කළ යුතුව ඇත්තේ සමාජයෙන් බැහැර වියයුතුව ඇති දේ බැහැර කරවීමට පෙළඹවීමයි. මේ තත්වයට අපේ පුවත්පත, ගුවන් විදුලිය හා රූපවාහිණිය යන සන්නිවේදන මාධ්‍ය දියුණු කරගත යුතුව තිබේ.

අංගුත්තර නිකායේ දක්වා ඇති අර්ථ සංරක්ෂණ උපදේශයන් කෙරෙහිද මෙහිදී මඳක් විමසා බැලීම ප්‍රයෝජනවත්ය.

පැරණි දේ පිළිසකර නොකිරිම.
ආහාර පානයන්හි සීමාවක් නොවීම.
දුස්සීල වූ අයහපත් පිරිමියෙක් හෝ ගැහැණියක් ප්‍රධානත්වයෙහි සිටීම.

15 පිටුවට...

ශාස්ත්‍රපති ලෙනදොර
සෝරත නායක ස්වාමීන් වහන්සේ

රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER
රංගිරි - ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය
රංගිරි දඹුල්ල සංවර්ධන පදනම,
අංක 130, දඹුල්ල.

දුරකථනය: 066-2283606 (දිගුව 161) හෝ 071 5361328
ෆැක්ස්: 066-2284603
ඊමේල්: rangirinewspapers@gmail.com
වෙබ් අඩවිය: www.rangirisrilanka.lk

## සාමය, සමෘද්ධිය, සංහිඳියාව සොයා පා නගමු.

"මාතා යථා නියං පුත්තං ආයුෂා ඒක පුත්ත මනු රක්ඛේ" යනුවෙන් තථාගතයන් වහන්සේ දේශනා කොට වදාළේ තම එකම පුතු ජීවිත පරිත්‍යාගයෙන් ආරක්ෂා කරන දයාබර අම්මා කෙනෙකු මෙන් ලොව සියලු දෙනා දෙස බැලිය යුතු බවකි. ඒ මවම ගෙදර බුදුන් අම්මා ලෙසින්ද ගෞරවයට පාත්‍ර වුයේ ලෝකයේ ආලෝකය මව වූ බැවිනි. ප්‍රකට දාර්ශනිකයෙකු වරක් ලෝකය බිහිවන්නේ හිරු එළියෙන් සහ මව් කිරියෙන් බව කියා පැවේද මවගේ දයාබරත්වය ලොවට හඬගා කියමිණි.

ලෝකය වෙනස් වෙයි. සමාජය විපරිණාමයට බඳුන්වෙයි. උතුම් මිනිසා සතු සාරධර්මතාවන්ද වේගයෙන් වෙනස් වෙමින් පවතියි. එකිනෙකා කා කොටා මරා ගන්නා ලෝකයක් අද බිහිව ඇති බව ලෝක සිදුවීම් පිළිබඳව සොයා බලන කාටත් හොඳින් වැටහෙයි.

ශ්‍රී ලාංකීය ජන සමාජයටද මෙම තත්වයෙන් අත්මිදිය නොහැකිය. නමුත් බහුතරයක් වූ බෞද්ධයන් මෙන්ම මෙරට වෙසෙන අන්‍යාගමිකයන් ද සිතිය යුතු කරුණක් වෙයි. එනම් වෙනස් වන ලෝක ප්‍රවණතා හමුවේ අපේ උරුමය අපේ සබැඳියාව සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව සුරකින්නේ කෙසේද කියාය.

යුරෝපය පුරා ආර්ථික ගැටළු පැණ නැගී ඇත. මැද පෙරදිග පුරා දරුණු ආගමික ගැටුම් පැතිර යයි. ජාතිය හා ආගමේ නාමයෙන් දිනපතා ලෝක ජනගහනයෙන් විශාල ප්‍රතිශතයක් මියයති. ඒ අතරිනුත් වැඩිදෙනා ළමුන්ය. කාන්තාවන්ය. නැතහොත් මහල්ලන්ය. ලෝකය මේ දෙස ඇස් ඇර බලන විට තවත් දහස් ගණනක් යළිත් මේ පොළොවේ මිහිදන් වී සිටිනු නිසැකය.

තොටිල්ල පදවන දෑතට ලොවක් පාලනය කළ හැකිය. මේ පුංචි රටේ සාමය, සංහිඳියාව සහ අනොන්‍ය බැඳීම ඇති කරලීමට කාන්තාවට මුල්විය හැකිය. අවි ආයුධ ගන්නා සෑම දරුණු පුද්ගලයෙකුම මවකගෙන් උපන්නෙකි. මව්කිරෙන් වැඩෙන්නෙකි.

මේ ලෝකය සුන්දර, සාමකාමී ලෝකයක් බවට පත්කිරීමේ වගකීම ඔබ සතුය. මව්වරුනි, පියවරුනි, මේ ගැන සිතන්න. පළමුව ඔබ නිවෙන්න. දෙවැන්න ඔබලාගේ දූ පුතුන් නිවා සනහාලන්න. එවිට අනාගත ලෝකය නිවී සැනහුණු ලෝකයක් වනු නොඅනුමානය.

කිසාගෝතමිය සිදුහත් කුමරාට කියූ අර්ථවත් කවිය මෙනෙහි කරන්න. මවගේ, පියාගේ නිවීම බිරිඳගේ නිවීම මේ ලෝකයේම නිවීමයි. අපි නිවුණු සැනහුණු රටක් බිහිකරමු. එහි පළමු පියවර නිවසේ නිවීමය. විවිධ රූපවාහිනී ඇතුලු විවිධ මාධ්‍යන්ගෙන් ගෙට එන පිටත ගිනි ඇතුලට නොගන්න. එසේම ගෙයි ගිනි පිටතට නොදෙන්න. සාමය, සංහිඳියාව, සමෘද්ධිය අසීරු ඉලක්කයන්ය. නමුත් අධිෂ්ඨානයෙන් කටයුතු කළහොත් ළඟා කරගත නොහැකි වන්නේ නැත.

බෞද්ධයිනි, ධම්ම පදය සුරතට ගන්න. එය හොඳින් කියවන්න. එය ධාරණය කරගන්න. ඒ අනුව හැසිරෙන්න. (සුනාථ ධාරෙථ චරාථ)

කිතුනුවන්ට බයිබලයත්, ඉස්ලාම් භක්තිකයන්ට කුරාණයත්, හින්දුන්ට භගවත් ගීතාවත් පරිහරණය කළ හැකියි. ඒ සියල්ලෙහි ඇත්තේ තම තම විශ්වාසයන්ට අයත් විශ්ව ධර්මතාවන්ය. ධර්මය පොතට සීමා වී මිනිසා ආගමෙන් වල්මත්ව හැසිරෙන බව අද අප ඇස් හමුවේ ප්‍රදර්ශනය වෙයි. මේ ව්‍යාජ ගමන ලෝකයට තවදුරටත් යා නොහැකිය. එනිසා දෑස් විවර කොට ලෝකය දෙස නුවණින් බලන්නැයි ඉල්ලා සිටීමට අපට සිදුව ඇත.

නිමල් කන්නංගර ආරච්චි



# 'පවුල' විශ්වාසවන්ත උතුම් නෑයාවේ

අප තථාගත සම්මා සම්බුදුරාජාණන් වහන්සේ දේශනා කළේ ඤාතීන් අතර උතුම් ඤාතියා විශ්වාසනීයත්වය ආරක්ෂා කළ පුද්ගලයා වන බවයි. මිනිස් සමාජය ගොඩනැගී ඇත්තේ 'පවුල' යන ඒකකය මත බව පැහැදිලිය. පවුලක් නිර්මාණය වන්නේ නිවසක ජීවත්වන ස්වාමියා, බිරිඳ, දරුවන්ගෙනි. ස්වාමියා, බිරිඳ සමඟ විශ්වාසනීයත්වයෙන් ක්‍රියා කරනු ලබයි. ජීවිතයේ ඇතිවන විවිධ ගැටලු ප්‍රශ්න සාකච්ඡා කරනු ලබන්නේ තම බිරිඳ සමඟය. බිරිඳ විසින් ඒවා ආරාක්‍ෂා කළ යුතුවන්නේය.විශාඛා දේවියට බුදුරාජාණන් වහන්සේ දේශනාකර ඇත්තේ ගෙයි ගින්දර පිටට නොදීමටත් පිට ගින්දර ගෙට නොගතයුතු බවයි.

තම ස්වාමියාට කලයුතු යුතුකම් නොපිරිහෙලා ඉටුකළ යුතු බවයි. ස්වාමියා තම ආරාක්ෂකයා මෙන්ම ඉටු දෙවියා ලෙසින් සැලකිය යුතු බව පෙන්වා දී තිබේ. ස්වාමියා විසින් තම බිරිඳ මෙහෙකාරියක් සේ නොසලකා යුතුකම් ඉටු කළයුතු බව බුදු දහමෙහි පෙන්වා දී තිබේ.(සිඟාලෝවාද සූත්‍රය) තම බිරිඳ ආරාක්‍ෂා කිරීමත් ආහාරපාන ආභරණ ආදියෙන් සංග්‍රහා කල යුතු බවත් විස්තර වෙයි. බිරිඳගේ අදහස් පිටතට නොදී ආරාක්‍ෂා කිරීමත් සමාජය හමුවේ ඇය උපහාසයට පත් නො කිරීමත් ස්වාමියාගේ වගකීමයි.

තම දරුවන් පිළිබඳවත් මේ අයුරින්ම සැලකිය යුතු වන්නේය. මේ සෑම අවස්ථාවකදී ම විශ්වාසය ආරාක්‍ෂාවන පරිදි ක්‍රියා කළ යුතු වන්නේය.එය මෙම සූත්‍ර ඇසුරෙන් (සිඟාලෝවාද වසල සූත්‍ර) පෙන්වා දී තිබේ.

පවුලේ සාමාජිකයන් අතර පැවැතිය යුතු විශ්වාස බවට හානියක් ඇති වුවහොත්, එතැන ඤාතීකමක් නමට තිබුණත් උතුම් නෑයෙකු නොවන්නේ ය යන්න අවධානය යොමුකළ යුතුය. තම ඤාතීන්ගේද විශ්වාස බවින් ආරාක්ෂා විය යුතුය. ඔවුනොවුන් අතර ගැටුම් ඇති කරන විවිධ ගැටළු නිර්මාණය කරමින් භේද භින්නතාවයන් ඇති කරන පුද්ගලයන් පාරම්පරික ඤාතීන් වූවත් උතුම් ඤාතියා යන සංඛ්‍යාවට අයත් නොවන්නේමය. තම සමාජය තුළ ගැටුම් ප්‍රශ්න ඇති කරන ඤාතීන් ඇසුරෙන් පවා ඈත් කලයුතු බව බුදු දහමෙහි පෙන්වා දෙයි. මිල මුදල් කඩා වඩා ගැනීමට නෑකම් කියාපාන පිරිස්ද අප ජීවත්වන සමාජය තුළ දක්නට ලැබේ.වාසියට නැති නෑදෑකම් ඇති කරගෙන (දුරස්ථ ඤාතීන්) ළඟට පැමිණ විවිධ දේ ඉල්ලා සිටිති. අඟහිඟකම් ඇති වූ විට ඈත්වෙන ගතියක්ද එවැනි ඤාතීන්ගේ ලක්‍ෂණය වේ. විපතක් ඇති වූ විට ඈත්වෙන ඤාතීන් ද සමාජයේ ජීවත් වෙති. එවැනි අයගේ ඤාතිකම් කිසිදු ප්‍රයෝජනයක් නොවේ. ඇති වන්නේ කායික මෙන්ම මානසික පීඩාවකි.

නාම මාත්‍රයෙන් හඳුන්වන ඤාතීන්ගෙන් ප්‍රයෝජනයක් ඇති නොවන අතර සිදුවන්නේ විනාශයකි. විපතේදී අත් නොහැර තම සෙවනැල්ල මෙන්ම එකට රැඳී සිටී නම් එය උතුම් ඤාතියෙකුගේ ලක්‍ෂණයකි. ධනය, බලය ඇති තැන ඤාතීන් ඒකරාශීවීම සාමාන්‍ය දෙයකි.ඔවුන් රැඳී සිටිනුයේ එම ශක්තිය ඇති අවස්ථාවේදී පමණි. එසේ ක්‍රියාකරත් ඤාතීන් දුරැකර කළ්‍යාණ ඤාතීන් හොඳින් හඳුනාගෙන එවුන් සමඟ ජීවත්වීමෙන් තම ජීවිතය සාර්ථක කරගත හැකි බව අවබෝධ කර ගත යුතු ය.

අජන්තා දිසානායක

# සඳ සිසිල

සංස්කාරක
"සඳ සිසිල"
රංගිරි ශ්‍රී ලංකා පුවත්පත
අංක 130,
නුවර පාර,
දඹුල්ල.



## වන්දනා



අනුරපුරය වෙත හැරුණෙමි
පස්පව් සෝදා හරනෙමි
අටමස්ථානය වැඳ වැඳ
නිවන් යන්න මඟ සොයනෙමි



මිහිදු ගලට නුවන් අයා
අනුබුදු හිමි ගීත ගයා
හද පිරිසිදු සෙනහසකින්
නමදිමි මිහි දෙයක් කියා



පොළොන්නරුව රජ දහනය
විසිතුරු සඳකඩ පහනය
වැඳ වැඳ මහිමිගෙ සිරිපා
පතනෙමි මතුවට සහනය



ලොකු පොඩි හැමදෙනට වගේ
ගරු සැලකිලි කරන අගේ
දඹුල්ලෙ බුදු පිළිමය වෙත
හරවමි සරසවිය මගේ



ඉපදුනදා සිටම වගේ
කලපව් හැර කැළණි ගඟේ
කැළණි විහාරය වැඳ වැඳ
පතනෙමි මොක්සුවය අගේ



හබරවැවේ රණතුංග රන්දෙණිය



## ආදර අම්මේ .....



මා කුස තුළ පිළිසිඳ ගත්බව,
දැනුනු දා සිට
දසමසක් යන තුරා
මෙළොව බිහි කරන්නට
කෙතරම් වෙහෙසක් දරන්නට
ඇතිද අම්මේ .........
මා වෙනුවෙන්ම ඔබ,
ඒ කාලය කැප කළේ,
කෙතරම් සතුටින්ද? අම්මේ .......
මා කුසෙහි හොවාගෙන
පෝෂණය ලබමින්
මෙළොව එළිය පෙන්වන්නට
උත්සුක වූ අම්මේ.......
එදින පටන් ලේ කිරි කර පොවා
ඇති දැඩි කරමින්
සිප් සතර ලබාදී
උකුලේ හොවාගෙන
හොඳ නරක පෙරා දෙමින්
ආදරය, සෙනෙහස
මා හට පෙවූ අම්මේ .......
ඉපදෙන සෑම ආත්මයේදීම
මගේම අම්මා වී
ඔබේ තුරුලේ උණුසුම විඳගැන්මට
මා හට අවසරයි අම්මේ.........
නොනිමි සෙනෙහසක්, ආදරයක්
පමණක් නොව
ජීවිතයට නොනිමි සෙවණක් වූ .........
සංසාර සාගරේ
ඔබ මගේම වේවා....!
මා ඔබේම වේවා.....!
සදාකල් මගේම ආදර අම්මේ......!!



සෙනාලි මධුෂිකා අඹගස්පිටිය

## අනගාරික ධර්මපාල ගුණ සැමරුම ....



අදිරද බලය මගෙ දැය පතුරා සිටින
යුගයක දැල්වුයේ දැව පහනේ වැටිය
ගමින් ගමට සරමින් සඳහම් කුටිය
ඔබ පෙන්වීය ජාතිය දිනවන හැටිය

දොන් ඩේවිඩ් අතැර දම්පල් නමින් යළී
හෙළ දරුවෙකුව ඉපදී ගුණ බරිනි දිලී
තුන් සිංහලය වැනසෙන පර සිරිතෙ ගැලී
පිස දැමුවේය ජාතිය මත වැටුන දැලී

ගෙරි මස් නොකවු රහමෙර පිටු දකිවු කියා
දුසිරිත නසන මඟ පෙන්වා දෙමින් ගියා
රැකගනු පිණිස බොදු උරුමය බුද්ධ ගයා
ඔබ නැගු කාහලය ඇත ජන හදේ ලියා

මගෙ රට මගේ ජාතිය හා සමය මගේ
පෙන්වා දුන් අගය ජාතික පියෙකු වගේ
නොසිටිය නමුදු මා මෙහෙවර අවැසි යුගේ
ඔබ පෙන්වූ මඟට නිතැනින් දෙපිය නැගේ

දෑ කුල සිරිත පර සිරිතට දී පාවා
බලවත් වෙසින් පෙර සිහළුන් රජ වූවා
ජාතික විපත පෙන්වා ඔබ එඩි පෑවා
දැය රැකුමට යළිත් සිරිලක ඉපදේවා

ඒ. එම්. වික්‍රමසිංහ අතපත්තු

## අගයමි ලෙඩට සැලකූ ඇය බරව බැතී....

ලොව්තුරු ගුණය ගලනා විට පිටාරව
දෙව්වරු දකී ගිලනුන් ගේ අමාරුව
පියවරු මව්වරුන් නෑකම් කියාතම
යතිවරු ඉරිසිවරු ලෙඩදුක් ඇරීහැම

පිවිතුරු නිල ඇඳුම කිරි කොකුනගෙ පාට
ඇතිතුරු දෙපය නොරිදෙයි පෙනුනත් කාට
දිවයුරු නිදා ගත්තත් නොනිදන රෑට
සමහරු මවක් ලෙස සලකනවා ඈට

සෙනසුරු අපල කර ලෙඩ වැළඳුන දාට
විසකුරු සපුන් හදිකර නොයෙකුත් පාට
වෙදදුරු සොයා පැමිණුන අසරණ යාට
වෙසතුරු මවුන් ළඟ නැත ග්‍රන්ථිය කේට

මුලකුරු නිලය කී හිස පළඳින සාට
අමයුරු මියුරු හඬතම එක්වෙයි රීට
වටකුරු කුඩා ඔරලෝසුව ඇති දාට
නරතුරු වැඩ කරන්නේ වැඩියෙන් කාට

සරණාගතවූ සිත කය සුවපත් කරන
පිපෙනා සුදු තඹුරු කඩිසරවී දුවන
අමනාපයක් නැති සේවය තුල නිපුන
පෙනුනා සිසි වුවන ගුණ නුවණින් පිරුන


එම් . එම්. කුලසිරි සිල්වා
''සමගි ගම'', කැකිරාව.

## දුකමයි සැප

මොහොතක්වත් ඉසිඹුලන්ට සිතකින්වත් නොයා
සිඟිති මුවේ සරු පලවැල රස තවරා තියා
වින්ද දුකම සැපයි කියා සිනහා පුරා පියා
අත්හරින්න පුරුදු පුහුණුකර නික්මී ගියා

බලන් නොලිය වූ ඒ පොත ජීවන සුවඳින් නැහැ උන
තුරුණු සමේ හිත නලියන රහමෙර බිඳුවත් අත්හළ
නුරා සිතින් ගෙට කැන්දන මැණිකේ මව් පදවි දරන
රාග තාල හැර වැයුවේ ජීවිතයේ ස්වර තාල

මහගිරි දඹ උනත් නැන්ගේ ඉරත් ළපැටියෙක්ය සිතා
සෙවණැල්ලට තැනක් දුන්නේ පැටවුන්ගේ සුව නොනසා
ඉනිමන් බැඳ වාරු දුන්නෙ කුසගින්නේ රස විමසා
අප්පච්චී කෙනෙක් උනේ පාරමිතා පිරූ නිසා



ඕපල්ගල චන්ද්‍රරතන හිමි

## මගේ රට

උතුම් බුදුරදුන් වැඩි මේ ලක් බිමට
හෙළ රජවරුන් රැකගත් දිවි දෙවෙනි කොට
සම්බුදු දහමෙ බලයෙන් අප අවදි කොට
ආසිරි පතන්නෙමි ලක්මව්නී ඔබට

මහවැලි කැළණි යන ගංගා සමනලයේ
කන්දෙන් සොබාසිරි ඔපවත්වී ආයේ
සුන්දර බවෙන් අප හදවත් සැනසූයේ
සිරිපා ලකුණ කඳුමුදුනෙහි රැඳවූයේ


අනුරපුර පොළොන්නරු ඉපැරණි නගරේ
වැව් බැඳි රජය යන විරුදාවලි පැතිරේ
කෙත්වතු සරු කෙලේ දිය දහරින් මිතුරේ
සාමය පැතුරුණේ හදවත් තුල උතුරේ

දළදා සමිඳු වැඩ හිඳිනා නුවර පුර
දම් සිසිලෙන් ඔකඳ වූ දළඳා මැදුර
සාදු නාදයෙන් ඔදවැඩි මේ උතුම් පුර
සැමදා දිලේවා ! මගේ මේ රුවන් පුර

ඇම්. ඩී. විජයවර්ධන



# දස සඤ්ඤා



භාග්‍යවත් සම්මා සම්බුදු පියාණන් වහන්සේ ගිරිමානන්ද හිමියන්ට වැළඳී ඇති රෝග උපද්‍රව දුරුකරලීම සදහා දේශිත සූත්‍රයයි. 'ගිරිමානන්ද' සූත්‍රය බුදුපියාණන් වහන්සේගෙන් අසා දරාගෙන ආනන්ද හිමි "ගිරිමානන්ද" හිමිට දේශනා කිරීමෙන් සියලු රෝගයන් දුරුවී සුවපත් බවට පත්විය. ඒ සූත්‍රයේ අන්තර්ගත දස සඤ්ඤා නිර්වාණ අවබෝධ සඳහා කෙතරම් දුරට යෝගාවරයා තම ජීවිතයට සම්බන්ධ කරගෙන සත්‍ය අවබෝධය සදහා පිළිපැදිය යුතු දැයි අප බුද්ධිමත්ව විමසිය යුතුය. එයින් ප්‍රකාශිත දස සඤ්ඤා කවරේද?

1 අනිච්ච සඤ්ඤා
2 අනත්ත සඤ්ඤා
3 අසුභ සඤ්ඤා
4 ආදීනව සඤ්ඤා
5 පහාන සඤ්ඤා
6 විරාග සඤ්ඤා
7 නිරෝධ සඤ්ඤා
8 සබ්බලොකේ අනභිරත සඤ්ඤා
9 සබබ සංඛාරේසු අනිච්ච සඤ්ඤා
10 ආනාපාන සති

මේ දස සඤ්ඤා වලින් පළමුවෙන් සඳහන් අනිච්ච සඤ්ඤාව බුද්ධානු මතයට අනුව විමසා බලමු. භව නිරෝධය පිණිස අනිච්ච සඤ්ඤාවේ යථාර්ථය අවබෝධ කරගනිමු.

1. අනිච්ච සඤ්ඤා

ආනන්දය කෙලෙස් තවන වීයඊයෙන් යුත් භික්ෂුව කැළයට හෝ ගසක් ලගට හෝ හිස් බිමකට ගොස් මෙසේ සිහිකරයි.

1 රූපය අනිත්‍යයි.
2 වේදනාව අනිත්‍යයි.
3 සංඥාව අනිත්‍යයි.
4 සංඛාර අනිත්‍යයි.
5 විඤ්ඤානයඅනිත්‍යයි.

11 කතමාචානන්ද අනිච්ච සඤ්ඤා

ඉධා නන්ද භික්ඛු අරඤ්ඤගතෝවා, රුක්ඛ මූල ගතෝවා, සුඤ්ඤාගාර ගතෝවා ඉති පටි සංචික්ඛති, රූපං අනිච්චං - වේදනා අනිච්චා - සඤ්ඤා අනිච්චා - සංඛාරා අනිච්චා - විඤ්ඤාණනං අනිච්චන්ති - ඉති ඉමේසු පඤ්ච උපාදානස්ඛන්ධේසු අනිච්චානු පස්සී විහරති.මේ ආකාරයටයි. අනිච්චානුපස්සනාව හෙවත් අනිච්ච සංඥාව වඩන අයුරු බුදු පියාණන් වහන්සේ විස්තර කරන්නේ කුමක්ද මේ අනිත්‍යතාවය ?

මෙහි දී විශේෂයෙන් සතා - පුද්ගලයා වශයෙන් පනවා ගෙන සම්මුති වශයෙන් ව්‍යවහාර කරන මේ ස්වභාවය සිතත් කයත් විද්‍යාමාන වන්නා වූ බඹයක් පමණ මේ ශරීරය සංකේතයක් සකස් වූවකි. සවිඥානකත්වය ඇති සත්ත්වයාද පරිබාහිර ගස්වැල් පර්වත මහපොළව සියලු විශ්වයෙහි විද්‍යාමාන වන්නාවූ ග්‍රහ වස්තු ද (අවිඥානක වස්තු ) සියලුම දෑ සංකතයකි. හටගත් දෙයක්. මේ හටගැනීමත් පණවා ගැනීමත් සිදුවන්නේ ස්වභාව ධර්ම 6 ක ක්‍රියාකාරිත්වයයි.එනම් පඨවි, අපෝ, තේජෝ, වායෝ, ආකාශ - විඤ්ඤාන - යන ධාතුන් ශක්තින් සුද්ධ ධර්ම නිතරම අතරක් නොමැතිව වෙනස් වෙනවා හෙවත් ඇතිවෙනවා නැතිවෙනවා. ප්‍රවර්ථනය වෙනවා හෙවත් චලනය වෙනවා.

මේ නිසාම ශක්තියක් බලයක් ජනිත වෙනවා. මේ ධාතු 6 නිරන්තර අනිත්‍යතාවය හෙවත් ඇතිවීම නැතිවීම නිසාම බලයක් විද්‍යාමාන වනවා. මේ ධාතු 6 හෙවත් ශක්ති 6 නිරන්තර ඇතිවීම නැතිවීම (අනිත්‍යතාවය) නිසා අනිත්‍යයි කියනවා. මෙයින් 4ක් එනම් පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ධාතු කිසිම ලෙසකින් වෙන්කරන්න බැහැ. වෙන් වෙන්නෙත් නැහැ.නිතරම එක ශක්තියක් වැඩි පුරගත් අවස්ථාවක් විද්‍යාමාන වෙනවා. පඨවි ශක්තිය වැඩිපුර ඇති රූපයක ඝනී භූත භාවය හෙවත් තද බව වැඩියි. අපෝ ශක්තිය වැඩිපුර ඇති රූපයක වැගිරෙන බව වැඩියි. තේජෝ ශක්තිය වැඩිපුර ගත් විට උණුසුම් වැඩියි. වායෝ ශක්තිය වැඩිපුර ගත් අවස්ථාවක හමායා ස්වභාවය දැකිය හැක.

මේ දැක්වූ ශක්ති හතර (පඨවි, අපෝ, තේජෝ, වායෝ) නිසිලෙසකින් සමව රූපයක් තුල විද්‍යාමාන නොවේ. මේ ධාතු හතරේ එකතුවට රූපයයි කියනු ලැබේ. ධාතුවල ස්වභාවය නිතරම චලනයයක් නිසා වේගවත් බවක් ප්‍රවේගයක් ඇතිවිම නැතිවීම නිසාම රූපය ද අනිත්‍යයි.

යමක් අනිත්‍යනම් දුකයි.(යදනිච්චං තං දුක්ඛං) යමක් දුක නම් අනාත්මයි. (යං දුක්ඛං තදනත්ථා) මේ නිසා සියලුම රූප ස්කන්ධයම අනිත්‍යයි.දුකයි, අනාත්මයි. මේ විස්තර කරනුයේ රූප ස්කන්ධයේ අනිත්‍යතාවයයි.සත්තවයා සම්බන්දව ආයතන 6 ක් ඇත. ඒවාට "අභ්‍යන්තර රූප" නම ධර්මයේ ව්‍යවහාර කෙරේ.

එනම්,
1 ඇස රූපය - ප්‍රසාද රූපය (චක්ඛු ප්‍රසාදය)
2 කණ රූපය - ප්‍රසාද රූපය
(සොත ප්‍රසාදය)
3 නාසය රූපය - ප්‍රසාද රූපය
(ඝාණ ප්‍රසාදය)
4 දිව රූපය - ප්‍රසාද රූපය (ජිව්හා ප්‍රසාදය)
5 කය රූපය - ප්‍රසාද රූපය (කාය ප්‍රසාදය)
6 මන රූපය - ප්‍රසාද රූපය (මනො ප්‍රසාදය)

මීට අමතරව බාහිර රූප කොටසකි. එනම්,

1 වර්ණ රූපය
2 ශබ්ද රූපය
3 ගන්ධ රූපය
4 රස රූපය
5 පොට්ඨබ්බ රූපය
6 ධම්ම රූපය


මෙසේ අභ්‍යන්තර රූපත් බාහිර රූපත් නැතහොත් සවිඥානකත්ව පිහිටි රූපත් අවිඥානකත්වය තුල විද්‍යාමාන වන්නාවූ රූපත් සියලු රූපස්කන්ධයම අනිත්‍යයි, දුකයි, අනාත්මයි.

අනිත්‍ය නම් - ගත හැකි රූපයක් නොවේ.(නිත්‍ය නොවේ)

දුක නම් - ගත යුතු රූපයක් නොවේ.

අනාත්ම නම් - තමාගේ වසගයේ නොපවතින ධර්මතාව යයි. මේ ස්වාභාව ධර්මය ප්‍රඥාවෙන් දකිත්ම දකිත්ම රූපස්කන්ධ හා බැදීම දුරුවී යතාර්ථය තුළම හෙවත් අනිත්‍යතාවය තුලම චිත්ත ඒකාග්‍රතාවය සිදුවනු ඇත.

පූජ්‍ය පණ්ඩිත ගම්පහ සිරි සීවලි හිමි.



# සතුට උතුම්ම ධනයයි

මිනිසා ජීවත් වනුයේ තරගකාරී ලොවක තරගකාරී ජීවන රටාවක් තුළ ය. එකී ජීවන රටාව ගත කරන මිනිසා මුදල් සෙවීමේ පරම චේතනාවෙන් සිය කාර්යයන් සිදුකරනු දැකිය හැකිය. කොපමණ මුදල් සෙවීම සිදු කළ ද ඉන් සෑහීමක් නොමැත. සතුටක් ජේන තෙක් මානයකවත් නොමැත. තව තව මුදල් සෙවීමට තව තව දුක් විඳිනු ඇත. එවන් මිනිසා සැමදා දුකින් සිටිනු විනා තාවකාලික හෝ සතුටකින් සිටිනු දක්නට ලැබීම ඉතා දුර්ලභ ය.

බුද්ධිමතුන්ගේ පිළි ගැනීමට අනුව මනුෂ්‍ය ජීවිතය සතුටෙන් තෘප්තියෙන් ගත කළ යුත්තකි. තෘප්තිය වැදගත් ජීවන අරමුණකි. මෙකී සත්‍ය කරුණ බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇත්තේ,

'සන්තුට්ඨී පරමං ධනං'

යනුවෙනි. එහි අරුත වනුයේ සතුට උතුම්ම ධනය වන බවය. එය ලද යුත්තේ අල්පේච්ඡතාව මගිනි. යථා-ලාභ සන්තෝෂය වශයෙන් සන්තුෂ්ටිය හඳුන්වනු ලබන අතර හුදු සිංහල වදනට අනුව ලද දෙයින් සතුටු වීම යන්න ගත හැකිය. ඉන් අකර්මන්‍යව කාලය ගත කිරීමට මග පෙන්වීමක් කිසිසේත් සිදු නොකරන බව දත යුතුය. පුද්ගලයා සතුටින් සිටිමට නම් නිරෝගිකම, ධනය, සමාජ ඇසුර යන සියල්ල තිබිය යුතුය. එසේ හෙයින් නිතැතින් නිරෝගිව සිටිමට වෙර දැරිය යුතුය. තවද ධනය ඉපැයිය යුතුය. ධාර්මික ධනෝපායන මාර්ගයයන් ඔස්සේ ධනය ඉපැයීම බුදු දහම පසසන අතර එකී ක්‍රමයයන්ට ධනය ඉපැයීමට බුදු දහම දිරි දෙයි. එනමුදු අධාර්මික ක්‍රමෝපායයන්ගෙන් ධනය ඉපැයීම බුදු දහම හෙළා දකියි.

තම ශක්ති ප්‍රමාණය අනුව තම සම්පත් දෙස බලා ඇති කර ගත හැකි සතුට 'යථා බල සන්තෝෂය' නමින් බුදු දහමේ පෙන්වා දෙනු ඇත. ලොව පුද්ගලයා විවිධාකාර ය. පුද්ගල ශක්‍යතා විවිධ ය. හැකි නොහැකිකම් විවිධ ය. ආර්ථික තත්ත්වය ද විවිධ වේ. එසේ හෙයින් තම ශක්ති ප්‍රමාණයෙන් උපයා ගත් දේ ගැන තෘප්තියෙන් යුතුව ආවර්ජනා කිරීම ඉතා වැදගත් වූවකි. යෝග්‍යතාව මිම්මක් ලෙස ගෙන ලබන සතුට 'යථා ස්වරූප සන්තෝෂය' නම් වේ. ලොව සම්පත් හා පරිසර හානිය නොවන පරිදි තමන්ටත් අවට සමාජයටත් ගැලපෙන සේ උචිත පරිභෝජන රටාවක් අනුගමනය කිරීම ඉන් ගම්‍ය වේ.

මෙයින් මැනවින් පිළිබිඹු වන්නා වූ කරුණක් වනුයේ සතුටෙහි නිසි ප්‍රායෝගිකත්වය ලැබීමට නම් තමාට මෙන්ම අනුන්ට ද හිතකර ආර්ථික රටාවක් හා ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීම පිණිස අල්පේච්ඡතාව සමග ගලපා ගැනීමෙන් යුතුව කටයුතු කළ යුතු බවය.

සතුටෙහි උපරිම සාධන අපේක්ෂා කරන්නෝ පැවිදි උතුමන් වන අතර උන්වහන්සේලා සිව්පසට පමණක් සීමා වී චාම් නිහතමානී සන්තුෂ්ට ජීවිතයක් ගත කරනු වස් අදාළ සීමා මැනවින් අවබෝධ කොට ගෙන වැඩ වසති. භික්ෂූන් වහන්සේලා ඉතා සැහැල්ලු වූ ද අත්‍යවශ්‍යය පිරිකර ප්‍රමාණයක් පමණක් දරති. කෙසේ ද යත් කුරුල්ලන් තම පියාපත් බර පමණක් ඇතිව සැහැල්ලුව පියාසර කරන්නාක් මෙනි. තැන තැන ගෙන යා හැකි තරම් ස්වල්ප වූ පිරිකර ප්‍රමාණයක් පමණක් දරන පැවිදි උතුමන් තුළ දක්නට ඇති තවත් සුවිශේෂීත්වයක් වනුයේ භාවනාරාමතා හෙවත් භාවනාවට ඇල්ම ඇති බවය. සන්තුඨිතා ලද භික්ෂුව තුළ එකී ලක්ෂණය පවතිනු ඇත. ලද සිව්පසෙහි ප්‍රණීතභාවය පිළිබඳ නොසලකා භික්ෂුව ඒ කෙරෙහි දුක්වීමක් හෝ අවමන් කිරීමක් නොකොට පවිත්‍ර දිවියක් ගත කරමින් දෙවියන්ගේ පවා ප්‍රශංසාවට ලක් වන්නෝ වෙති. එය ධම්ම පදයෙහි,

අප්ප ලාභෝ පි චෙ භික්ඛු
සලාභං නාති මඤ්ඤති
තං වෙ දෙවා පසංසන්ති
සුද්ධාජීවිං අතන්දි තං

යනුවෙන් දක්වා ඇත. එසේහෙයින් සන්තුෂ්ටිය භික්ෂු ජීවිතය තුළ ඉතා වැදගත් ගුණ ධර්මයක් බව පෙනී යනු ඇත.

නූතන සමාජයේ මිනිස් සංහතිය තුළ සතුට නැති වන්නේ කුමක් හේතුකොට ගෙන ද යන්න පිළිබඳව විමසීම කාලෝචිත ය. අද සමාජයේ මිනිසා නිතැතින් තරගකාරී දිවියකට හුරුව ඇත. එකෙකු පරයා එකෙකු නැගී සිටිමේ චේතනාවෙන් යුතු මිනිසාගේ ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය, පළිගැනීම ආදී වූ දුර්ගුණවලින් හදවත පෝෂණය වී ඇත. එබැවින් ඔවුහු මුදල් ඉපැයීමට සිත යොමා සිටිනවා මිස එකී මුදල ධාර්මිකව ඉපයීම පිළිබඳව නොසිතති. කුමන හෝ ක්‍රියාවකින් තරගකාරී ලෙස මුදල් උපයා ගනිති. එවිට සතුටක් සිතෙහි රැඳී නොපවතිනු ඇත. ලද දෙයින් සතුටු වීමක් දක්නට නැත. කොපමණ දෑ ලදත් තව තව සොයති. අනෙකෙකුට වඩා තමාගේ වස්තුව වැඩි කර ගැනීමේ චේතනාවෙන්ම වස්තුව සොයති. එවැනි තැනැත්තාට විවේකයක් ද නැත. එසේ හෙයින් සතුටක් ද නැත.

පුද්ගලයාට නිසි සතුටක් ලැබීමට නම් විවේකය හා විනෝදය ද අවශ්‍ය වේ. විවේකය විනෝදයෙන් ගත කළ යුතු අතර එය ද ධාර්මික විය යුතුය. ධාර්මිකව විවේකය විනෝදයෙන් ගත කිරීම බුදු දහම අගය කරනු ඇත. බුදු දහම අගය කරනු ලබන බොදු කලා ශිල්ප රැසක් අප සතුව ඇත. ලියකම් මල්කම් යනාදිය ද ඉන් වැදගත් වේ. ඒ තුළින් පුද්ගලයාගේ නිර්මාණාත්මක හැකියාව ද ඔප් නංවනු ඇත. තොරණ පෙරහැර ආදී කටයුතු සංවිධානය මෙන්ම එකී කටයුතු ඉටු කිරීම තුළින් ද ධාර්මික විනෝදයක් ඇති වනු නියති. බැති ගී ගැයීමෙන් සිතට දැනෙන්නා වූ අසීමිත වින්දනය ද සතුට ගෙන දෙන්නකි.

සැදැහැ සිතින් පරිත්‍යාගකිරීම තුළින් ද බොදු ජනයා සතුටු වනු ඇත. දන්සැල් යනාදිය තුළින් ද ගම්‍ය වනුයේ එවැන්නකි. තමා දැහැමිව උපයා සපයා ගත් දේ යොදවා විනෝදය ගත කිරීම පිළිබඳ සිතීමෙන් ද සතුටක් ලැබෙනු ඇත. එබැවින් විවේකය විනෝදයෙන් ගත කිරීම පුද්ගලයාගේ සතුටට ඉතා වැදගත් කරුණක් වනු ඇත.

එසේ හෙයින් අප ජීවත් වන ඉතා කෙටි කාලය සතුටින් සිටිය යුතුම ය. එසේ සතුටින් සිටීමට හැකි වනුයේ ධාර්මිකව දිවි පෙවෙතක් ගෙන යනවානම් පමණක් බව ද දත යුතුය. අධාර්මික දිවි පෙවෙත තුළින් ලබන්නා වූ සතුට තාවකාලික වූවකි. එසේ වුවද ධාර්මික දිවිය තුළින් ලබන්නා වූ සතුට ධාර්මික සතුටක් වනු ඇත. එබැවින් අප උපයා සපයා ගන්නා ධනයෙහි උතුම්ම ධනය වන සතුට නිසි පරිදි උපයා සපයා ගැනීමට බොදු ජනයාගේ සිත් සතන් යොමු වීම ඉතා කාලෝචිත ය.

ආර්. එන්. එච්. එම්. සමන් ජයරත්න

# දරිද්‍රතාවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්

මිනිසුන් දරිද්‍රතාවයට පත්වීම සම්බන්ධයෙන් විවිධ ආගමික සමූහයන් විසින් ද අවධානය යොමු කොට තිබේ.දරිද්‍රතාවය යනු කුමක් ද යන්න පිළිබඳ බුදුරාජාණන් වහන්සේ විසින් පහත සඳහන් ලෙස අංගුත්තර නිකායේ චක්ක නිපාතයේ දක්වා තිබේ.

ලෝවැසි සියලුදෙනාට ජීවත්වීම සඳහා ධනය අවශ්‍යය.බුදුදහමට අනුව දුප්පත්කම මිනිසාට දුකකි.දුප්පත්කම පිළිබඳ සාපයෙන් හිරිහැර විඳින මිනිසා තම මූලික භෞතික අවශ්‍යතා පිනවා ගන්නට නොහැකිව අසහනයෙන් පෙළේ. මිනිසුන්ගේ මූලික අවශ්‍යතා ඉටු කරගැනීමට මුදල් අවශ්‍ය බවත් එලෙස සම්පාදනය කරගත නොහැකි පුද්ගලයින් දුකට හා පීඩනයට පත්වන බවත් බුදුන් වහන්සේ විසින් පෙන්වා දී තිබේ. එවන් පුද්ගලයන්ට බෞද්ධයන් ලෙස හැකි පමණින් ආධාර උපකාර කළ යුතු බවත් ඒ තුළින් ලැබෙන පිං වලින් පරලොව ජීවිතය අගතියකින් තොරව සුගතිගාමී කරගත හැකි බවත් බුදුන් වහන්සේ වදාළ සේක (උපුටා ගැනීම, රාහුල හිමි,2008 : 21).

මිනිසුගේ ජීවිතයට කර්මය බලපාන ආකාරය පිළිබඳව බුදුරාජාණන් වහනසේ චූලකම්ම සුත්‍රයේ දේශනා කොට තිබේ. මානවකය සත්ත්වයෝ කර්මය ස්වකීය කොට ඇත්තාහ. කර්මය දායාද කොට ඇත්තාහ. කර්මය ඉරණම් කොට ඇත්තාහ. කර්මය බන්ධු කොට ඇත්තාහ. කර්මය මේ හීන පුනර්භවය පිණිස සත්ත්වයන් විභාග කෙරේ යැයි වදාළහ. (උපුටා ගැනීම,ලංකා නන්ද හිමි සහා සුමනසාර හිමි, 2006 : 433 ). මේ අනුව පෙනී යන්නේ කර්ම ශක්තිය අනුව මිනිසුන් දුප්පත් වී උප්පත්තිය ලැබීමට හේතු වන බවයි.

කුසල කර්ම බලයෙන් සුගතියක ධනයෙන් ආරූඪ වූ උප්පත්තියක් ලැබිය හැකි බව පෙන්වා ඇත. එසේ ම කුසල කර්මයක ප්‍රතිවිපාක වශයෙන් දුප්පතේකුට, පොහොසෙතෙකු විය හැක. බෞද්ධයින් වැඩි දෙනෙකු අද බුද්ධාගම පිළිපදින්නේ මරණින් මතු සැපයක් ලැබීමටය (සිරි සීවලි හිමි,1966 : 206).

ඉහත පැහැදිලි කිරීම් අනුව ඉහත ආත්ම බවවලදී කුසල කර්ම හේතු කොටගෙන මේ භවයේදී පොහොසතකු ලෙස ඉපිද ඇති බවත් ඊළඟ භවයේ දී පොහොසතකු ලෙස ඉපදීම සඳහා මෙම භවයේ දී කුසලකර්ම සිදුකළ යුතු බවත් බුදුරාජාණන් වහන්සේ විසින් වදාළ සේක.සම්මෝහන විනෝදනී විභංග අටුවාවේ ඥාන විභංග වර්ණනාවේ සඳහන් කරන ආකාරයට ''සත්ත්වයාගේ දුක සැප පිණිස පවත්නා ධන ධාන්‍ය, යාන වාහන, ගේ දොර, වතුපිටි ආදියේ සමෘද්ධිය හා විනාශය ද කර්ම බලය නිසා සිදුවෙයි'' (උපුටා ගැනීම,සිරිසීවලි හිමි,1966 :330)

ඉහත විග්‍රහයට අනුව කර්මය හේතු කොටගෙන අයෙකුගේ සම්පත් විනාශවීමෙන් දුප්පතෙකු විය හැකි බවත් එකවිට සම්පත් ලැබී පොහොසතකු බවට පත් වන්නේද කර්ම ශක්තිය අනුව බවත් බුදුන් වහන්සේ වදාළ සේක.සම්පත් හිමිව ඉපදුණත් මිනිසුන් දුකට විනාශයට මෙන්ම දරිද්‍රතාවට පත් විය හැකි හේතුන් විස්සක් බුදුන් වහන්සේ විසින් පරාභව සූත්‍රයෙහි දේශනා කර තිබේ.ඒවා නම් ,

යහපත් ධර්මය අප්‍රිය කරලීම, අවිදිවියී ධර්මය, නිදිබරව කල් ගෙවීම, දොඩමලුව කල්යැවීම, වීර්යයෙන් තොරවීම, මැලිබවින් යුක්තවීම. මව්පියන් නොරැකීම, බොරුවෙන් මහණ බමුණන් රැවටීම, බොජුන් සඳහා ගිජුකම, ජාතිය, කුලය, ධනය යන මෙයින් උඩඟුව නෑයන් පහත් කොට සැලකීම, ස්ත්‍රීන් කෙරෙහි ලොල් බව, සුරාවෙහි ලොල් බව, වෙසඟනන් කරායෑම, පර අඹුවන් පතායෑම, මහළුව තරුණියන් විවාහ කරගැනීම, ලොල් වූ අරපරිස්සම් නැති ස්ත්‍රියක හෝ පුරුෂයෙකු ඉසුරුතන්හි තබා ගැනීම සහ වස්තුවෙන් අඩු වූ තෘෂ්ණාවෙන් වැඩි වූ ක්ෂත්‍රීය කුලයක උපන්නෙකු රාජ්‍යයට නුසුදුස්සෙකු පැතීම (උපුටා ගැනීම, වනරත්න, 1988: 41 - 42 )

වර්තමාන සමාජය දෙස බැලීමේ දී ඉහත කරුණු එකක් හෝ දෙකක් ඊට වැඩි ගණනක් හේතුවෙන් මිනිසුන්ගේ ආර්ථික තත්වය පහත වැටී මිනිසුන් දරිද්‍රතාවයට පත්වෙති.මිනිසුන් දරිද්‍රතාවයට හා දුකට පත්වන කරුණු පිළිබඳව සිගාලෝවාද සූත්‍රයෙහි ද බුදුරාජාණන් වහන්සේ විසින් දේශානා කර තිබේ. මෙහි දී මිනිසුන් පිරිහීමට ලක්වන කරුණු හතරක් සඳහන් කර තිබේ. ඒවා නම්,

01.ස්ත්‍රී ලොල් බව
02.සුරා ලොල් බව
03.සූදූ කෙලියෙන් ලොල් බව
04.පාප මිත්‍රයන් ඇසුරු කිරීම (උපුටා ගැනීම, රාහුල හිමි, 2008: 17).

ස්ත්‍රීන් ලොල් බවට පත්වන පුද්ගලයින් තමා සතු ධනය සහා සම්පත් ලබා දෙමින් ස්ත්‍රීන් පසුපස යාම තුළින් ඔවුන් සතු සම්පත් විනාශ කරගනු ලබන අතර ඒ තුළින් මිනිස්සු දරිද්‍රතාවයට පත්වෙති.සුරා ලොල් බවට පුද්ගලයෝ පත්වීම නිසා තමා සතු ධනය වැය කරමින් සුරා පානය කරවීම හේතුවෙන් තම ධනය මෙන්ම සෞඛ්‍ය පිරිහීම තුළින් ජීවිතය ද කෙටි කර ගනිති. දූ කෙළියට ලොල් වූ පුද්ගලයෝ සිහින ලෝකවල ජීවත්වෙමින් තම ධනය සූදුව සඳහා යෙදවීම තුළින් ආර්ථිකය දුර්වල කර ගනිති.ඒ තුළින් පුද්ගලයින් දරිද්‍රතාවට පත්ව සිටින අකාරය පැහැදිලි වෙයි. පාප මිත්‍ර සේවනය මඟින් ඉහත සඳහන් කරන සියලුම දුශ්ශිලයන්හි නිරතවීම හා කණ්ඩායමක් ලෙස සංවිධානය වෙමින් විවිධ සමාජ විරෝධී ක්‍රියාවන් වල නිරත වීම තුළින් යහපත් ජීවිත ගත කරන මිනිසුන්ගේ ද ජීවිත විනාශ කරමින් සමාජයේ යහපාලනය බිඳ දමමින් ඔවුන්ගේ ජීවිත ගමන පමණක් නොව අනුන්ගේ ජීවිතද ඔවුහු උෟ අනතුරට ඇද දමති.

මිනිසුන් දරිද්‍රතාවට පත්වීම සඳහා බලපෑ හේතුන් මෙන්ම ඒ තුළින් සමාජය පත්වන තත්වයන් ද ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ද පිළිබඳව බුදුරාජාණන් වහන්සේ දේශනා කර තිබේ.බෞද්ධ දර්ශනයට අනුව පුද්ගලයින් දුප්පත්ව ඇත්තේ පෙර භවයක දී කරන ලද අකසල කර්ම හේතුවෙන් බවත් එවන් තත්ත්වයකින් මිදීම සඳහා මෙම භවයේ දී හැකි තරම් කුසල් සම්පාදනය කරගත යුතු බවත් දේශනා කර තිබේ.

**පී.නන්දන.පී.වික්‍රමසිංහ,**
**විද්‍යාවේදී (ජීව විද්‍යා),**
**ශාස්ත්‍රපති (සමාජ විද්‍යාව),**
**දර්ශනපති (සමාජ විද්‍යාව),**
**උපසභාපති ජාතික විද්වත් සංවිධානය,**
**කෑගල්ල දිස්ත්‍රික්කය**



**(ඡායාරූප අන්තර්ජාලයෙනි)**


පේරි ගාථා ඇසුරෙන් -
භද්‍රා
කුණ්ඩලකේශී
9
කතා සැකසුම හා චිත්‍ර පාලිත සපුආරච්චි
සිටු තුමණී.. මේ ආහාරීන.. භද්‍රාට සැර වැරවී.. මෙය.. ...විසඳන්ට බැහැ...
ඉතිං... තුමන්ද සිටු දේවිය මට කරන්න කියන්නේ...
අප කුමක් හෝ කළ යුතුයි ස්වාමීනි... මේ අපට සිටින එකම දරුවා.. ඇගේ ඉල්ලීම අප කෙසේ හෝ ඉටුකර දිය යුතුයි.....
ඔව්.. දේවිය.. මා ඒ බව දන්නවා.. නමුත් මෙය ඉටු කළ හැක්කන්ද..?
ඇගේ.. අදහස එය නම් අප කුමක් හෝ විසඳුමක් කළ යුතුයි.. නමුත්
රජ තුමාට මේ ගැන.. හෙළි වුවහොත්.. අප සැමටම.. මැරුම් කන්න සිදුවේවි...
සිටු තුමණි... අප රාජ පුරුෂ යින්ට.. රන් කහවණු ලබාදී සත්තුකව සිරගෙයින් නිදහස් කරගනිමු.. රාජ.. පුරුෂයින් සත්තුකව කෙසේ හෝ මුදලයි..
මේ සඳහා යොදාගනිමු.. ඔහු ලවා රාජ පුරුෂයන්ට කතා කරවා.. රන් කහවණු දී... ඔහුව සිරගෙයින්.. නිදහස් කර ගනිමු...
නුඹ අපගේ හිතවත්ම.. සමීපතම සේවකයායි.. ඒ නිසයි මා නුඹවම මේ සඳහා තෝරාගත්තේ මොක රහසක් නමු අපවත් වෙන.. නුඹත් හෝරී.. මෙම කාර්යය ඉටු කරයි කියා.. මා... සිතනවා....
එහෙමයි..
ඔව්.. දේවිය.. අපි.. අපිට හිතවත්ම.. සේවකයාව....
එහෙමයි සිටුතුමණි.. මම මේ ගැන කිසිවෙකුටවත්... දැන ගන්න ඉඩ තියන්නේ නෑ
හිමි.. හොඳයි..
දියණිය භද්‍රා. දියණිය භද්‍රා
ඔහ්.. මෑණියෙනි

රංගිරි ශ්‍රී ලංකා
RSL NEWSPAPER




# වියරු රැදු වදන් ඇසේය මිනිස් පුරවරින්...

මිනිස් කමට නම්බු නාම
දුන් මිනිස් මුවින්
මිනිස්කමට නිගා ගෙනෙන
වියරු රුදු වදන්
ඇසේය මිනිස් පුරවරින්

කල්පනා සොඳය මනුපුර
බෝසතුන් මවන තරමට
කල්පයේ දැවෙන සිත්නෙත්
නිවාලන ලෙසා
කප්තුරෙත් සැදෙයි පිළිලද
මල් මගෙත් සිටිත් දෙබරුද බල
සහසකුත් අසති දෙව්දත් දනන්ගේ මුසා...

පිල් හැපී අඬන මොනරුද
බිඳී තැවෙන කෙසරුද
කලියුගේ හොඳත් නොහොදයි
නිගා දෙනු අසා
නියගයත් වැසිත් සදන අහස සේම
විඳිමු ගැරහුම්
මුනිවරුත් බොරළු රළු මග
ඇවිද ගිය නිසා....

ගේය පද - වසන්ත කුමාර කොබවක
ගැයුම හා ස්වර - ආචාර්ය රෝහණ වීරසිංහ


වසන්ත කුමාර කොබවක


ආචාර්ය රෝහණ වීරසිංහ

ලොව වෙසෙන මිනිසුන් අතරින් කිසිවෙකුත් සම්පූර්ණයෙන් ම නිවැරදි පුද්ගලයෝ නොවෙති. එමෙන් ම කිසිවෙකුත් සම්පූර්ණයෙන් ම නරක පුද්ගලයෝ නොවෙති.

එනම් සුදුත් නොවන කලුත් නොවන සුදු හා කලු විවිධ ප්‍රමාණයෙන් මිශ්‍ර වූ අළු පාට චරිතයන්ය. අපට හමුවනුයේ රහසත් පව් නොකරන පුද්ගලයන් වන්නේ බුදුවරු සහ රහතුන් පමණි.

කෙලෙස් නොනැසූ සියලු ම මිනිසුන් හොඳ නරක සුසං යෝගයකින් සැදුණු පුද්ගලයෝ වෙති.

ජීවිතයේ විවිධ අවස්ථාවල දී ප්‍රකට කරන්නා වූ හැසිරීම් අනුව "හොඳ" හෝ "නරක" යැයි පුද්ගලයින් ව නාමකරණය කෙරේ.

සිග්මන් ෆ්‍රොයිඩ් පවසන්නේ ද මිනිසා යනු සදචාරයට වසන්ව තම නොසන්සිඳෙන ආශාවන් යටපත් කරගත් ජීවියෙකු ලෙස ය

."මිනිස් හට සොඳුරු ගුණ හා නුගුණ ඇත, නිදොස් කෙනෙක් මේදියත උපදනේ නැත" යනුවෙන් සුභාෂිත කතුවරයා පවසන්නේ ද මිනිස් සිතේ ස්වභාවයයි.ගරු බුහුමන් කර පුද පූජා කළ හැකි උසස් වූ මනුසත් ගුණයම විටෙක මිනිස්කමට නොගැලපෙන පහත් ක්‍රියාවන්ගෙන් යුක්තවෙයි.

තම දෙමාපියන් පණ මෙන් රැක ගන්නා දූ පුතුන් මෙන්ම මව පියා මහළු මඩමක හෝ මහ මග අතරමං කර යන දරුවන් ද අද අපේ සමාජයේ බහුලව හමු වේ.

මේ කෲරකම් සිදුවන්නේ වත්මන් සමාජයේ පමණක් යැයි පැවසුව ද රාජ්‍ය ලෝභිත්වයෙන් පියා මැරූ අජාසත්ත වැනි පුතුන් බුද්ධ කාලීන භාරතයේ ද විසූහ.

එනම් මිනිස් සිතේ කලු සුදු ස්වභාවය අතීත අනාගත වර්තමාන තුන් කාලයටම පොදු වූ මිනිස් ස්වභාවයක් බව පැහැදිලි ය.

මිනිමැරුම්, මංකොල්ලකෑම්, අල්ලස් ගැනීම්, ස්ත්‍රී දූෂණ , ළමා අපයෝජන ආදී නොයෙකුත් සමාජ විරෝධී ක්‍රියා රැසක් අපට ජන මාධ්‍යයෙන් නිතර ම අසන්නට දකින්නට ලැබෙයි. මෙවන් සමාජ අපගාමී සිදුවීම් නිරන්තරයෙන් ප්‍රචාරය කිරීම තුළ එය පුද්ගලයාගේ මනසට අභ්‍යන්තරීකරණය වී පසුව සාමාන්‍යකරණය වෙයි.

එනම් මෙම දුරාචාරයන් පොදු ජනතාවට සාමාන්‍ය සිදුවීම් බවට පත් වේ. යුද්ධය, සුනාමි ව්‍යසනය ආදී සිදුවීම් වල ලේ වැගිරීම්, සමූහ මරණ ආදිය මිනිසුන්ට සාමාන්‍ය සිදුවීම් බවට පත් විය. එනිසා අපරාධ වලට පෙළඹීම් ද වැඩි විය.

එබැවින් ජනමාධ්‍ය අපරාධ වාර්තාකරණයේ දී ස්වයං වාරණයක් මෙන්ම ජනමාධ්‍ය ආචාර ධර්ම වලට අනුකූලව කටයුතු කළ යුතු ය. එමෙන් ම ජනමාධ්‍ය මෙන්ම සමාජය විසින් වැඩි ඉඩකඩක් ලබා දෙනුයේ සමාජ විරෝධී ක්‍රියා උලුප්පා පෙන්වීමටය. එක් පුද්ගලයෙකු හෝ කණ්ඩායම් මගින් සිදුකරන යහපත් ක්‍රියාවන්ට ලැබෙන ප්‍රචාරය අඩු ය.

මේ නිසා යහපත් දේ යටපත්ව අයහපත් දේ ඉස්මතු වෙයි. බුදුවරු බෝසත්වරු දැවෙන සිත් සනසාලන්නට කොතෙකුත් උපදෙස් දුන්න ද ලෝකයම රවටන දෙව්දත්වරුන්ගේ උපදෙස් වලට ද මිනිස්සු රැවටෙති. ලෝකයේ ස්වභාවය එයයි. එනිසා හොඳ නරක සත්‍ය අසත්‍ය අඩු වැඩි වශයෙන් ඇති ලෝකය තුළ අප අවධි වූ මනසකින් යුතුව ක්‍රියා කළ යුතු ය.

යහපත යටපත් වී අයහපත ඉස්මතු වන ලෝකය තුළ ද තම බලය අහිමි වූ නායකයෝ ද බලවන්තයෝ ද තැවෙමින් මනසින් දැවෙමින් සිටිති. එමෙන්ම සාධාරණය ඉටු නොවීම නිසා කෝපයටත් වේදනාවටත් පත් මිනිසුන් ද බොහෝ ය.

යහපත වෙනුවට අයහපත රජයන කලියුගයේ මේ සියල්ල සාමාන්‍ය යැයි සිතා උපේක්ෂාවෙන් සිටින්නට අපට සිදුවෙයි. නියගය නිසා දෝෂාරෝපණ අසන අධික වර්ෂාව නිසාත් දොස් අසන අහස සියළු ගැරහුම් විඳිමින් ඉවසන්නා වූ අහස සේ අප ද මැදහත් සිතින් සිටිය යුතුය.

දිවැස් ලාභීන් ද තම සෘධිය පාවිච්චි කර අහසෙන් නොයා රළු බොරළු මාවතේ ගමන් කිරීම තෝරා ගත්හ. එනිසා හොඳ නරක මැද නොසැලී නොවැටී සිටින්නට අප අධිෂ්ඨානය කළ යුතු ය.

ගේය පද රචක වසන්ත කුමාර කොබවකයන් සමාජයේ යථාර්ථය අපට පෙන්වා දෙමින් නොසැලී සිටින්නට උපදෙස් දෙයි. අචාර්ය රෝහණ වීරසිංහයන්ගේ ස්වර සංයෝජනය හා ගැයුමද මැනවින් සුසංයෝජනයව ඇත.

ලාභ අලාභ යස අයස මැද ගලන මේ ජීවිත ගමන නොසැලී සිටින්නට බුදු දහම පෙන්වා දෙන මැදුම් පිළිවෙත අපට වඩාත් යෝග්‍ය වන බව මෙයින් පැහැදිලි ය.

චාමිකා ජනානි ද සිල්වා




නිකන් කියවන්නේ ඇයි? පොතක් කියවමු.



# තුන්සිත පිරිසිදු කොට දුන් දානය උන් ගිය ගිය තැන ලැබෙයි නිධානය

මේ වස්සාන කාලයයි. ගමත්, පන්සලත් අතර ඇති අධ්‍යාත්මික සබඳතාවය දිනෙන් දිනට වැඩි වන පුණ්‍යවන්ත කාල සීමාව මෙයයි. සැදැහැවත් බෞද්ධ ජනයා දානය, සීලය, භාවනාව ආදී ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා අතරින් දානයට මේ කාලයේදී ඉතාමත් වැඩි නැඹුරුවක් දක්වති.

ඒ වස් සමාදන් වී සිටින මහා සංඝයා වහන්සේලාට දන් පැන් පිළිගැන්වීමෙන් කුසල් සිදුකර ගැනීමට පෙළඹෙන නිසාවෙනි. සිත, කය, වචනය, යන තුන් දොරම පිරිසිදු කොට ගෙන දන්දීම තුළින් මෙලොව පරලොව දෙකම යහපත් කර ගතහැකි බව බෞද්ධයන් වන අප සියලු දෙනා තරමක් දුරට හෝ දන්නා කරුණකි. බුද්ධ ප්‍රමුඛ මහා සංඝයා වහන්සේට දෙන දානය බොහෝ ආනිසංස ඇති බවත් දහමෙහි සඳහන් වෙයි.

මේ ලිපියෙන් ''දානය'' පිළිබඳව සාකච්ඡා කිරීමට මා සිතුවෙමි. ''දානය'' යනු පොදුවේ ගත් කල 'දීම'' යන අර්ථයයි. ඇති අය නැති බැරි අයට සිල්වත්, දුසිල්වත් සෑම කෙනෙකුටමත් තිරිසන් සත්ත්වයින්ටත් ආහාරයක් ලබාදීම දානයයි. එය ආනිසංස වශයෙන් වෙනස් වේ. එසේ වුවත් ආහාර පමණක් දීම ''දානය'' ලෙස අර්ථවත් නොවේ. තමන්ට හැකි ඕනෑම දෙයක් දීම දානයයි. එයට ආශාවෙන් දන් දීම සිදු නොකළ යුතුය. ඉන් ඒ පුද්ගලයාට සිදු වන්නේ අකුසලයකි.

පරිත්‍යාග චේතනාවෙන් දන්දිය යුතුය. පිරිසිදු සිතින් දන්දීම තුළින් සිතෙහි ඇතිවන ප්‍රසාදය ප්‍රීතිය ''පින'' ලෙස අර්ථවත් වේ. පින යනු සිත පිනා යාමයි. (චිත්තං පුණාතිති පුඤ්ඤං) පැහැදුණු සිතින් දන් දීම තුළින් තම සිතෙහි සතුටක් උපදින්නේද එය පිනයි. ඒ තුළින්ම දානය මහාර්ඝ වූ පුණ්‍ය ක්‍රියාවක් වෙයි. දන්දීම තුළින් තෘෂ්ණාව නැති වේ. වර්තමානයේදීද බොහෝ සැදැහැති ජනතාව දන්දීම සිදු කරති. දන්සල් ආදිය පවත්වමින් සිදු කරති. ඒ වාගේම තමන්ට හැකි උපරිමයෙන් දන් දෙමියි යන අදහසින්ද දන් දෙන බොහෝ පිරිස් අද දක්නට ඇත.

නමුත් තමා විසින් වෙහෙස මහන්සි වී සකස් කරන දානය තුළින් බොහෝ ආනිසංශ ලැබෙන බව මුදුන් වහන්සේ පවා දේශනා කොට තිබේ. බොහෝ පිරිස් අද වන විට දානය සකස් කිරීම තමන්ගේම ශ්‍රමයෙන් නොකර අනුන් ලවා සිදුකරනු දක්නට ලැබේ.

මුදල් මත පදනම් වූ අනුන් ලවා සහ විධාන කොට සකස් කර දන්දීමට වර්තමානයේ බොහෝ පිරිස් පුරුදු වී ඇත. නමුත් වීදාගම මහා මෛත්‍රී හිමියන් රචනා කර ඇති ලෝවැඩ සඟරාව නම් කෘතියේ දානය දිය යුතු ආකාරය මෙසේ දක්වා ඇත.

**''අන් හට අලසව නොකොට විධානය**
**පින් මිස අනිකක් නොකොට පදානය**
**තුන් සිත පිරිසිදු කොට දුන් දානය**
**උන් ගිය ගිය තැන ලැබෙයි නිධානය''**

(ලෝවැඩ සඟරාව - 06 කවිය, වීදාගම හිමි)

එයට අනුව ''කම්මැලිකමින් අනුන්ට විධාන නොකොට (අණ නොකර) පින් ලැබීම මිස අන් කිසිවක් ප්‍රදාන නොකොට ගෙන මුල, මැද, අග යන තුන් තැන සිත පිරිසිදු කොට දන් දුන්නොත් ඔවුන් උපනූපන් තන්හි මහත් වස්තු ලබන්නේය'' යනුවෙන් ලෝවැඩ සඟරා කතුවරයා දක්වයි.

ඉන් කියවෙන්නේ අනුන්ට විධාන නොකොට තමා විසින්ම දන්දිය යුතු බවයි. පින් පමණක්ම ප්‍රධාන කොට ගත යුතු බවයි. තුන් සිතම (සිත, කය, වචනය) පිරිසිදු කොටගෙන දන් දීම කළ යුතු අතර ඔවුන්ට මෙලොව පරලොව දෙකේදීම සැප ලැබෙන බව ඉහත කවෙන් කියැවෙයි.

එසේම බුදුගුණ වර්ණනා කිරීමත් සිත පාපයෙන් දුරු කර ගැනීමත්, පරලොව දිනීමත් වර්ණනා කිරීමෙන්, තැනීමෙන්, දිනීමෙන් උතුම් බව පවසන ලෝවැඩ සඟරා කවියා දීමෙන් උතුම්ම දීම දානය හා පින බවද පවසා ඇත්තේ පහත අයුරිනි.

''වැනුවා නම් බුදු ගුණ වැනුවාමය
තැනුවා නම් තම සිත තැනුවාමය
දෙනුවා නම් දන් පින් දෙනුවාමය
දිනුවා නම් පරලොව දිනුවාමය

(ලෝවැඩ සඟරාව - 74 කවිය)

මේ අන්දමට දීම හෙවත් ''දානය'' ඉතා උතුම් බව වීදාගම හිමියෝ දක්වා ඇත. තවදුරටත් ''දානය'' පිළිබඳව කරුණු දක්වන ලෝවැඩ සඟරා කතුවරයාණෝ,

''ඇතුළට වැදගෙන ඇවිලෙන ගින්නේ
පිටතට ගත් බඩුමය වැඩ වන්නේ
මෙසිතට ගෙන ලොබ නොව දන් දෙන්නේ
තමහට එම වද මතු පල දෙන්නේ''

යනුවෙනුත්,

**''බුදිනට ගත් බත් පිඩ මිස වෙන නැත**
**යදිනට දන් දෙව මතු දුක් නොවිඳින**
**මෙමහට ඇත ඉතිරිය දෙමි යන සිත**
**සැම රට රජ සිරි සැප ලදුවත් නැත''**

(ලෝවැඩ සඟරාව - 107 - 108 කවි)

එහි සඳහන් අන්දමට, ''ගෙතුලට ගිණි වැද ඇවිලෙන කල්හි පිටතට ගත් දෙයක්ම ප්‍රයෝජන වන්නේය. මෙය සිතට ගෙන ලෝභ නොවී දන් දෙව. තමන්ට මතුඵල දෙන්නේ ඒ දානමය කුසල කර්මයමයි'' - (107)

''කන්ට ගත් බත් පිඩ මිස වෙන යමක් නැත්නම් ඒ බත් පිඩවත් අනාගතයේ දුක් නොවිඳිනු පිණිස යාචකයන්ට දන් දෙව. මට දූන් මේ ප්‍රමාණය සෑහේය. එයින් වැඩි කොටස දන් දෙමි.'' යන ත්‍යාග චේතනාව ඇතිවුවද රාජ්‍ය සම්පත්තිය ලැබූ නමුත් ඒවා ඇති නොවන්නේය.''

- (108)

''වීදාගම හිමියන් '' දානය දිය යුත්තේ කෙලෙසද, දන් දීමේ ඵල විපාක මොනවාද යන්නත් ඉතා මැනවින් ලෝවැඩ සඟරාවේ දක්වා ඇති බවත් ඉහත උදාහරණයන්ගෙන් අපට හැඟීයයි. නිවසට ගිණි ගෙන ඇවිලෙන විට පිටතට දැමූ දෙයක් පමණක් අපට ඉතිරිවෙයි. එම නිසා දනට ලෝභ නොවිය යුතුය. එසේ දුන් දානයේ ඵල විපාක අනාගතයේ දුක් නොවිඳීම පිණිස හේතුවෙයි. එමෙන්ම එක් බත් පිඩක් පමණක්ම වුවත් දන්දීමෙන් අනාගතයේදී දුකින් මිදිය හැකි බව ''ලෝවැඩ සඟරාව'' රචනාකළ අප යතිවරයාණන් මැනවින් පහදා දී ඇත. එසේම දානය දීමෙහි ආනිසංසද උන් වහන්සේ මෙසේ තම ග්‍රන්ථයෙන් පහදා දී ඇත. එක් දුගී මිනිසෙක් බුදුන් කාලයේ අනුරුද්ධ හිමියන් පිඩු සිඟා වඩිනු දැක තමා කෑමට සොයාගත් දෙයින් එක් බත් හැන්දක් සැදැහැ සිතින් පිළිගැන්වීය. ඒ පුණ්‍ය කර්මය හේතු කොටගෙන ඒ දුගියා දිව්‍ය ලෝකයෙහි ''ඉන්දික'' නමින් අධිපති දෙවියෙක් ලෙස උපත ලැබූ බවත් මේ ආනිසංස දැන හැදිනගෙන නුවණැසින් යුතුව දන්දීම උතුම් යැයි පවසා ඇත්තේය.

**''සිගපත් එකෙක් පෙර අනුරුදු තෙරුන් දැක**
**තම ලත් බතින් දුන්නේ එකම සැන්දෙක**
**බලවත් එයින් සුරපති වීය ඉන්දක**
**නැණවත් කරවූ දන්පින් පල මෙයින් දැක''**

(ලෝවැඩ සඟරාව 125 කවිය)

යන ආකාරයෙනි. මේ ආකාරයට ලෝවැඩ සඟරාව .දන් දීමත් එහි ආනිසංසත් දක්වා ඇත්තේ ලෝ වැසි බොදු ජනතාවට සෑම ස්ථානයකදීම ප්‍රමුඛ වන දානය පිළිබඳව මනා අවබෝධයක් ලබාදීම පිණිස මහත් පරිශ්‍රමයක් දරා ඇත. දානය යන්න ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවලත්, දස කුසල්වලත් දස රාජ ධර්මවලත්, සතර සංග්‍රහ වස්තු වලත්, දස පාරමිතාවලත් ප්‍රමුඛයා වෙයි. මේවා බොදුනුවන් වන අප මද වශයෙන් හෝ දන්නා කරුණුය.

දන්දීමෙහි වටිනාකම හෙළ බොදු යතිවරුන් පමණක් නොව පෙර සංස්කෘත පඬිවරු පවා පවසා තිබේ. ''ව්‍යස'' නම් සංස්කෘත පඬිවරයෙකු ලියන ලද ''ව්‍යාසකාරය'' නම් ග්‍රන්ථයේ දානය පිළිබඳව පවසා ඇත්තේ මේ අයුරිනි.

**''දානං විභූෂණං ලෝකේ**
**දානං දුඃඛ නිවාරණම්**
**දානං සගීස්‍ය සෝපානං**
**දානං ශාන්තිකරම් පරම්''**

(ව්‍යාසකාරය, 44 ගාථාව)

එහි දක්වා ඇති අයුරින් දානය තමා පැළඳි ආභරණයකි. දුක් නිවාරණය කරන්නකි. ස්වර්ගයට යන ඉනි මඟකි. දානය පරම ශාන්තිය ලබා දෙන්නකි.'' යනුවෙන් දක්වයි. මෙයින් අපට පෙනී යන්නේ දානය බෞද්ධ අපට පමණක් නොව ලෝවාසී සියලු දෙනාගේම ඇගයුමට ලක් වූ පුණ්‍ය කර්මයක් බවයි.

එසේ නම් ලොව ශ්‍රේෂ්ඨතම නායකයා වන අප බුදුරජාණන් වහන්සේගේ බොදු මඟ යන බොදුනුවන් වන අප දානයේ අනුසස් දැනගෙන එය සැදැහැයෙන් කළයුතු අයුරු නුවණින් දැනගෙන දෙලොව අභිවෘද්ධිය පිණිස දන් දෙමු. ජීවිතය අර්ථවත් කර ගනිමු. බොදුමඟ යමු.

**එස්. දිල්රුක්ෂි අබේකෝන්**

# දන් දෙන පිළිවෙලට දන් දෙමු

මේ වස්සාන කාලයයි. ගමත්, පන්සලත් අතර ඇති අධ්‍යාත්මික සබඳතාවය දිනෙන් දිනට වැඩි වන පුණ්‍යවන්ත කාල සීමාව මෙයයි. සැදැහැවත් බෞද්ධ ජනයා දානය, සීලය, භාවනාව ආදී ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා අතරින් දානයට මේ කාලයේදී ඉතාමත් වැඩි නැඹුරුවක් දක්වති. ඒ වස් සමාදන් වී සිටින මහා සංඝයා වහන්සේලාට දන් පැන් පිළිගැන්වීමෙන් කුසල් සිදුකර ගැනීමට පෙළඹෙන නිසාවෙනි. සිත, කය, වචනය, යන තුන් දොරම පිරිසිදු කොට ගෙන දන්දීම තුළින් මෙලොව පරලොව දෙකම යහපත් කර ගතහැකි බව බෞද්ධයන් වන අප සියලු දෙනා තරමක් දුරට හෝ දන්නා කරුණකි. බුද්ධ ප්‍රමුඛ මහා සංඝයා වහන්සේට දෙන දානය බොහෝ ආනිසංස ඇති බවත් දහමෙහි සඳහන් වෙයි.

මේ ලිපියෙන් ''දානය'' පිළිබඳව සාකච්ඡා කිරීමට මා සිතුවෙමි. ''දානය'' යනු පොදුවේ ගත් කල 'දීම'' යන අර්ථයයි. ඇති අය නැති බැරි අයට සිල්වත්, දුසිල්වත් සෑම කෙනෙකුටමත් තිරිසන් සත්ත්වයින්ටත් ආහාරයක් ලබාදීම දානයයි. ආනිසංස වශයෙන් වෙනස් වේ. එසේ වුවත් ආහාර පමණක් දීම ''දානය'' ලෙස අර්ථවත් නොවේ. තමන්ට හැකි ඕනෑම දෙයක් දීම දානයයි. එයට ආශාවෙන් දන් දීම සිදු නොකළ යුතුය. ඉන් ඒ පුද්ගලයාට සිදු වන්නේ අකුසලයකි. පරිත්‍යාග චේතනාවෙන් දන්දිය යුතුය. පිරිසිදු සිතින් දන්දීම තුළින් සිතෙහි ඇතිවන ප්‍රසාදය ප්‍රීතිය ''පින'' ලෙස අර්ථවත් වේ. පින යනු සිත පිනා යාමයි. (චිත්තං පුණාතිති පුඤ්ඤං) පැහැදුණු සිතින් දන් දීම තුළින් තම සිතෙහි සතුටක් උපදින්නේද එය පිනයි. ඒ තුළින්ම දානය මහාර්ඝ වූ පුණ්‍ය ක්‍රියාවක් වෙයි. දන්දීම තුලින් තෘෂ්ණාව නැතිවේ. වර්තමානයේදීද බොහෝ සැදැහැති ජනතාව දන්දීම සිදු කරති. දන්සල් ආදිය පවත්වමින් සිදු කරති. ඒ වාගේම තමන්ට හැකි උපරිමයෙන් දන් දෙමියි යන අදහසින්ද දන් දෙන බොහෝ පිරිස් අද දක්නට ඇත. නමුත් තමා විසින් වෙහෙස මහන්සි වී සකස් කරන දානය තුළින් බොහෝ ආනිසංශ ලැබෙන බව මුදුන් වහන්සේ පවා දේශනා කොට තිබේ. බොහෝ පිරිස් අද වන විට දානය සකස් කිරීම තමන්ගේම ශ්‍රමයෙන් නොකර අනුන් ලවා සිදුකරනු දක්නට ලැබේ. මුදල් මත පදනම් වූ අනුන් ලවා සහ විධාන කොට සකස් කර දන්දීමට වර්තමානයේ බොහෝ පිරිස් පුරුදු වී ඇත. නමුත් වීදාගම මහා මෛත්‍රී හිමියන් රචනා කර ඇති ලෝවැඩ සඟරාව නම් කෘතියේ දානය දිය යුතු ආකාරය මෙසේ දක්වා ඇත.

අන් හට අලසව නොකොට විධානය
පින් මිස අනිකක් නොකොට පදානය
තුන් සිත පිරිසිදු කොට දුන් දානය
උන් ගිය ගියතැන ලැබෙයි නිධානය''
(ලෝවැඩ සඟරාව. 06 කවිය - වීදාගම හිමි)

එයට අනුව '' කම්මැලිකමින් අනුන්ට විධාන නොකොට (අණ නොකර) පින් ලැබීම මිස අන් කිසිවක් ප්‍රදාන නොකොට ගෙන මුල, මැද, අග යන තුන් තැන සිත පිරිසිදු කොට දන් දුන්නොත් ඔවුන් උපනූපන් තන්හි මහත් වස්තු ලබන්නේය'' යනුවෙන් ලෝවැඩ සඟරා කතුවරයා දක්වයි. ඉන් කියවෙන්නේ අනුන්ට විධාන නොකොට තමා විසින්ම දන්දිය යුතු බවයි. පින් පමණක්ම ප්‍රධාන කොට ගත යුතු බවයි. තුන් සිතම (සිත, කය, වචනය) පිරිසිදු කොටගෙන දන් දීම කළ යුතු අතර ඔවුන්ට මෙලොව පරලොව දෙකේදීම සැප ලැබෙන බව ඉහත කවෙන් කියැවෙයි.

එසේම බුදුගුණ වර්ණනා කිරීමත් සිත පාපයෙන් දුරු කර ගැනීමත්, පරලොව දිනීමත් වර්ණනා කිරීමෙන්, තැනීමෙන්, දිනීමෙන් උතුම් බව පවසන ලෝවැඩ සඟරා කවියා දීමෙන් උතුම්ම දීම දානය හා පින බවද පවසා ඇත්තේ පහත අයුරිනි.

වැනුවා නම් බුදු ගුණ වැනුවාමය
තැනුවා නම් තම සිත තැනුවාමය
දෙනුවා නම් දන් පින් දෙනුවාමය
දිනුවා නම් පරලොව දිනුවාමය
(ලෝවැඩ සඟරාව - 74 කවිය)



මේ අන්දමට දීම හෙවත් ''දානය'' ඉතා උතුම් බව වීදාගම හිමියෝ දක්වා ඇත. තවදුරටත් ''දානය'' පිළිබඳව කරුණු දක්වන ලෝවැඩ සඟරා කතුවරයාණෝ,

ඇතුළට වැඳගෙන ඇවිලෙන ගින්නේ
පිටතට ගත් බඩුමය වැඩ වන්නේ
මෙසිතට ගෙන ලොබ නොව දන් දෙන්නේ
තමහට එම වද මතු පල දෙන්නේ

යනුවෙනුත්

බුදිනට ගත් බත් පිඩ මිස වෙන නැත
යදිනට දන් දෙව මතු දුක් නොවිඳින
මෙමහට ඇත ඉතිරිය දෙමි යන සිත
සැම රට රජ සිරි සැප ලදුවත් නැත

(ලෝවැඩ සඟරාව - 107 - 108 කවි)

එහි සඳහන් අන්දමට ''ගෙතුලට ගිණි වැඳ ඇවිලෙන කල්හි පිටතට ගත් දෙයක්ම ප්‍රයෝජන වන්නේය. මෙය සිතට ගෙන ලෝභ නොවී දන් දෙව. තමන්ට මතුඵල දෙන්නේ ඒ දානමය කුසල කර්මයමයි'' (107)

''කන්ට ගත් බත් පිඩ මිස වෙන යමක් නැත්නම් ඒ බත් පිඩවත් අනාගතයේ දුක් නොවිඳිනු පිණිස යාචකයන්ට දන් දෙව. මට දූන් මේ ප්‍රමණෙය සෑහේය. එයින් වැඩි කොටස දන් දෙමි.'' යන ත්‍යාග චේතනාව ඇතිවුවද රාජ්‍ය සම්පත්තිය ලැබූ නමුත් ඒවා ඇති නොවන්නේය.'' (108)

''වීදාගම හිමියන් '' දානය දිය යුත්තේ කෙලෙසඳ, දන් දීමේ ඵලවිපාක මොනවාද යන්නත් ඉතා මැනවින් ලෝවැඩ සඟරාවේ දක්වා ඇති බවත් ඉහත උදාහරණයන්ගෙන් අපට හැගීයයි. නිවසට ගිණි ගෙන ඇවිලෙන විට පිටතට දමූ දෙයක් පමණක් අපට ඉතිරිවෙයි. එම නිසා දනට ලෝභ නොවිය යුතුය. එසේ දුන් දානයේ ඵලවිපාක අනාගතයේ දුක් නොවිඳීම පිණිස හේතුවෙයි. එමෙන්ම එක් බත් පිඩක් පමණක්ම වුවත් දන්දීමෙන් අනාගතයේදී දුකින් මිදිය හැකි බව ''ලෝවැඩ සඟරාව'' රචනාකළ අප යතිවරයාණන් මැනවින් පහදා දී ඇත. එසේම දානය දීමෙහි ආනිසංසද උන් වහන්සේ මෙසේ තම ග්‍රන්ථයෙන් පහදා දී ඇත. එක් දුගී මිනිසෙක් බුදුන් කාලයේ අනුරුද්ධ හිමියන් පිඩු සිගා වඩිනු දැක තමා කෑමට සොයාගත් දෙයින් එක් බත් හැන්දක් සැදැහැ සිතින් පිළිගැන්වීය. ඒ පුණ්‍ය කර්මය හේතු කොටගෙන ඒ දුගියා දිව්‍ය ලෝකයෙහි ''ඉන්දික'' නමින් අධිපති දෙවියෙක් ලෙස උපත ලැබූ බවත් මේ ආනිසංස දැන හැඳිනගෙන නුවණැසින් යුතුව දන්දීම උතුම් යැයි පවසා ඇත්තේ,

''සිගපත් එකෙක් පෙර අනුරුදු තෙරුන් දැක
තම ලත් බතින් දුන්නේ එකම සැන්දෙක
බලවත් එයින් සුරපති වීය ඉන්දක
නැණවත් කරවූ දන්පින් පල මෙයින් දැක''
(ලෝවැඩ සඟරාව 125 කවිය)

යන ආකාරයෙනි. මේ ආකාරයට ලෝවැඩ සඟරාව .දන් දීමත් එහි ආනිසංසත් දක්වා ඇත්තේ ලෝ වැසි බොදු ජනතාවට සෑම ස්ථානයකදීම ප්‍රමුඛ වන දානය පිළිබඳව මනා අවබෝධයක් ලබාදීම පිණිස මහත් පරිශ්‍රමයක් දරා ඇත. දානය යන්න ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවලත්, දස කුසල්වලත් දස රාජ ධර්මවලත්, සතර සංග්‍රහ වස්තු වලත්, දස පාරමිතාවලත් ප්‍රමුඛයා වෙයි. මේවා බොදුනුවන් වන අප මද වශයෙන් හෝ දන්නා කරුණුය.

දන්දීමෙහි වටිනාකම හෙළ බොදු යතිවරුන් පමණක් නොව පෙර සංස්කෘත පඬිවරු පවා පවසා තිබේ. ''ව්‍යස'' නම් සංස්කෘත පඬිවරයෙකු ලියන ලද ''ව්‍යාසකාරය'' නම් ග්‍රන්ථයේ දානය පිළිබඳව පවසා ඇත්තේ මේ අයුරිනි.

''දානං විභූෂණං ලෝකේ
දානං දුඃඛ නිවාරණම්
දානං සගීස්‍ය සෝපානං
දානං ශාන්තිකරම් පරම්''
(ව්‍යාසකාරය, 44 ගාථාව)

එහි දක්වා ඇති අයුරින් දානය තමා පැළඳි ආභරණයකි. දුක් නිවාරණය කරන්නකි. ස්වර්ගයට යන ඉනි මඟකි. දානය පරම ශාන්තිය ලබා දෙන්නකි.'' යනුවෙන් දක්වයි. මෙයින් අපට පෙනී යන්නේ දානය බෞද්ධ අපට පමණක් නොව ලෝවාසී සියලු දෙනාගේම ඇගයුමට ලක් වූ පුණ්‍ය කර්මයක් බවයි. එසේ නම් ලොව ශ්‍රේෂ්ඨතම නායකයා වන අප බුදුරජාණන් වහන්සේගේ බොදු මඟ යන බොදුනුවන් වන අප දානයේ අනුසස් දැනගෙන එය සැදැහැයෙන් කළයුතු අයුරු නුවණින් දැනගෙන දෙළොව අභිවෘද්ධිය පිණිස දන් දෙමු. ජීවිතය අර්ථවත් කර ගනිමු. බොදුමඟ යමු.

**එස්. දිල්රුක්ෂි අබේකෝන්**

# කඨිනය ඇතිරීමෙන් ශක්තිමත් වන කඨින පිංකම්



බුදු සසුනේ භික්ෂූන් වහන්සේලා උදෙසා බුදු රදුන් අනු දන වදාළ වස් විසීම ආරම්භ වන්නේ ඇසළ පොහෝ දිනයේදීය. එම පොහොය තුළ ගිහි පක්ෂයට ඇතුළත් වන උපාසක උපාසිකාවන් විසින් භික්ෂූන් වහන්සේලාට විහාරස්ථාන වල තෙමසක් වස් වසන ලෙස ආරාධනා කරති. චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස යන සිව් පසයෙන්ද උපස්ථාන කරන බවට පොරොන්දු වෙති. එම ඉල්ලීම ද සැලකිල්ලට ගෙන සෑම විහාරස්ථානයක් තුළම වැඩ වසන භික්ෂූන් වහන්සේලා ''ඉමං තේමාසං වස්සං උපේමි '' යන පාඨයට අනුව වස් විසීම සිදු කරනු ඇත.

එම වස් කාලය තුළ භික්ෂූන් වහන්සේලා විසින් පෙර වස් හෝ පසු වස් හෝ එළඹීම අනිවාර්යෙන්ම කළ යුතුය. එය බුද්ධ නියමයයි. මේ දෙ දිනෙන් එක් දිනක හෝ වස් එළඹීම නොකළ භික්ෂුවට ''න භික්ඛවෙ, වස්සං න උපගන්තබ්බං, යො න උපගච්ඡෙය්‍ය ආපත්ති දුක්කටස්ස'' යනුවෙන් මහණෙනි වස් නො එළඹිය යුතු නොවේ. යමෙක් වස් නො එළඹෙන්නේ නම්, දුකුළා ඇවැත් වේ යැයි මහා වග්ගයේ වස්සුපනායිකක්ඛන්ධකයෙහිදී බුදුහු වදාළහ.

බුදුරජාණන් වහන්සේ රජගහනුවර වැඩ සිටි සමයෙහි භික්ෂූන් වහන්සේලා වස්සාන ඍතුවේත් චාරිකා චරණයෙහි යෙදෙමින් දඹදිව පැවති පෞරාණික ධර්මයන් උල්ලංඝනය කළ බැවින් භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට ''අනුජානාමි භික්ඛවෙ වස්සානෙ වස්සං උපගන්තුං'' යනුවෙන් මහණෙනි මම වස්සාන ඍතුවෙහි වස් එළඹෙන්නට අනුදනිමියි වදාළහ.

ඉහත කාරණයත් සමඟ සම්බන්ධ වන වස් පවාරණය සිදුවීම ඉතා වැදගත් කරුණකි. එය තුන් මාසයක් වස් සමාදන් වී එය ආරක්ෂා කළ භික්ෂුව විසින් කළ යුතු විනය කටයුත්තකි. ඇසළ පෝයෙන් ආරම්භවී වප් පෝයෙන් අවසන් වන වස් විසීම, ඊළඟට සිදුවන්නේ කඨින චීවර පූජාවට පෙනී සිටීමයි. එය සිදුවන්නේ වප් පෝයේ සිට ඉල් පෝය දක්වායි. එසේ නම් පළමු තුන් මස වස් සමාදන් වී වස් පිංකම් නොහොත් කඨික චීවර පූජා සිද්ධ කිරීමට පෙරාතු ව සිදුවන මෙම මහා පවාරණය වැදගත් සංසිද්ධියකි.

කඨිනත්වය කාලය වශයෙන් විනයෙහි පරිවාර පාළියෙහි එය මෙසේ සඳහන් වෙයි.

''කඨිනස්ස අත්ථාරමාසො ජානිතබ්බෝති'' යනුවෙන් වස්සාන ඍතුවේ අවසාන මාසය කඨිනත්තාර කාලය වශයෙන් දනගත යුතු යැයි වදාරා තිබේ.

බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සමයෙහි තිස් නමක් පමණ වූ භික්ෂූන් වහන්සේලා අතරමඟදී වැස්සට තෙමීමෙන් දියෙන් පිරුණු සිවුරු වලින් යුතුව ක්ලාන්ත ගතියෙන් පැමිණියාහුය. එම භික්ෂූන් වහන්සේලා මුහුණ පෑ එම කරදරය දක බුදුරදුන් ''අනුජානාමි භික්ඛවෙ වස්සං වුත්තානං භික්ඛුනං කඨිනං අත්ථරිතුං'' යනුවෙන් මහණෙනි, වස් වැස නිම කළ භික්ෂූන්ට කඨින ඇතිරීම අනුදනිමියි'' වදාළ සේක. කඨිනස්තරණය නම් වූ එම විනය කර්මය සිදු කිරීමෙන් භික්ෂූන් වහන්සේලාට පඤ්චානිසංස ලැබෙන බවද දේශනාවෙහි සඳහන් වේ.

කඨිනයක් ලබා ගැනීමේ දී භික්ෂුවක් සම්පූර්ණ කර තිබිය යුතු කරුණක් හැටියට වස්සාන ඍතුවේ මුල් මාසය වන ඇසළ පුන් පොහෝ දා පොහොය කොට අව පැළවිය දා පෙරවස් එළඹ වස් කඩා නොගෙන තුන් මාසය මුළුල්ලෙහි එය මැනවින් ආරක්ෂා කොට වප්පුර පසළොස්වක දා මහා පවාරණයෙන් පවාරණය කළ භික්ෂුවක් වීම පෙන්වා දිය හැකිය. කඨිනය අතුරනු ලැබූ වෙහෙරින් පිටත අනෙක් වෙහෙරක වස් විසූ භික්ෂූනට ද අයත් නැත. ඒ අය ගණපූරක භික්ෂූහු වෙති.

වස් තුන් මාසයෙන් පසු එළඹෙන වප් පොහොය තුළ කඨින ඇතිරීම සිදු කිරිම ඉතා වැදගත් විනය පටිපාටියකි. ඊට පසු කඨින චීවර පූජාවක් සිදුවීම සෑම විහාරස්ථානයකම සිදුවේ. එතුළින් භික්ෂූන් තුළ පවතින අඩුපාඩු සැකසීමද, නොහික්මුණු භික්ෂූන් හික්මෙන ස්වභාවයකින් ද යුක්තවීමද ප්‍රතිපත්තියකි.

බුදුරජාණන් වහන්සේ කාලීන වශයෙන් තුන් කාලයටම ගැලපෙන අයුරින් එම ප්‍රඥප්තිය පනවා තිබීම සාසනයේ චිරස්ථිතිය උදෙසා වැදගත් වේ. චීවරය තරම් උතුම් හා වන්දනා මානයට ලක්වන වස්ත්‍රයක් තවත් නොමැත. මෙවැනි විනය ප්‍රඥප්ති පැනවීමෙන් සිදුකර ඇත්තේ එහි වටිනාකම තව තවත් උසස් කිරීමයි.

කඨිනය ඇතිරීම සිදුකොට කඨිනයක් පරිභෝග කිරීමට භික්ෂුව අංග අටකින් සම්පූර්ණ වියයුතුය. එනම්,

1.පුබ්බකරණං ජානාති - පූර්ව කරණය දනීම (තුන් සිවුර පිළිබඳව)

2.පච්චුද්ධාරං ජානාති - පුරාණ තුන් සිවුරු පිළිබඳ පච්චුද්ධාරය දනීමය.

3.අධිට්ඨානං ජානාති - අධිෂ්ඨානය දනීමය.

4.අත්ථාරං ජානාති - අත්ථාරය දනීමය.

5.මාතිකං ජානාති - අෂ්ට මාතෘකාව දනීමය.

6.පළිබොධං ජානාති - පළිබෝධය දනීමය.

7.උද්ධාරං ජානාති - උද්ධාරය දනීමය.

8.ආනිසංසං ජානාති - ආනිසංස දනීමය.

ඉහත දක්වන ලද අංග අටෙන් යුක්ත භික්ෂුව කඨිනාස්තරනයට සුදුසු වන බව විනයෙහි දක්වා තිබේ. එය තරමක් අසීරු වුවද උපසම්පන්න භික්ෂුවක් විසින් කළ යුතුව ඇත. ඒ තුළින් භික්ෂුත්වය ආරක්ෂා වනවා සේම ''විනයො නාම සාසනස්ස ආයු'' කී ආකාරයට සාසනයේ පැවැත්මට ද එය හේතු වන්නේය.

**කොබෙයිගනේ පුබ්බිලිය**
**ශ්‍රී සාරානන්ද පිරිවෙනේ ආචාර්ය**
**ගලගෙදර රතනවංශ හිමි**

08 පිටුවෙන්...

නිවසක පරිහරණයට ඇති භාණ්ඩ ආදියත් පොදුවේ මහජනතාවගේ ප්‍රයෝජනයට වෙන්වී තිබෙන ස්ථානයනුත් පැරණි වැව් අමුණු ආදියත් පිළිසකර නොකර සිටීමෙන් විශාල ධනයක් වැයකර එබඳු ස්ථාන නැවත ගොඩනගා ගැනීමටත් භාණ්ඩ ආදිය සපයා ගැනිමටත් සිදුවේ. බෞද්ධයකු ආහාරපාන ගත යුත්තේ ජීවත් වීමට අවශ්‍ය නිසා මිස ආහාර සඳහාම ජීවත්වන්නකු ලෙස නොවේ. තමන් උපයන ධනය වැඩි ප්‍රමාණයක් ආහාර පිණිස වැය වීමෙන් වෙනත් වුවමනා එපාකම් සම්පූර්ණ කර ගැනීම අපහසු වේ.

අයහපත් ගතිගුණවලින් හෙබි තැනැත්තෙකු සිටීමෙන් සිදුවන්නේ ද ආයතනයක හෝ නිවසක හෝ රටක ධනය විනාශ වී යාමකි. වර්තමාන සමාජය දෙස බලන විට පැහැදිලි වන්නේ පටු හැඟීම් නිසා නිසි පුද්ගලයාට හිමිවිය යුතු තැන නොලැබීමෙන් රටේ සම්පත් අනිසි ලෙස විනාශ වන අවස්ථාවන්ය. ධනය ආරක්ෂා වීමටත් රටේ දියුණුවක් ඇති වීමටත් නම් බුදු දහමට අනුව සිදුවිය යුත්තේ සුදුස්සාට සුදුසු තැන හිමිකර දීමය.

උත්සාහයෙන් ධනය තම තමන් විසින් රැස් කරගන්නා අතර එම ධනය නිසිසේ පරිහරණය කිරීමෙන් ජීවිත ආලෝකමත් වේ. සමාජයේ කීර්ති ප්‍රශංසා අපේක්ෂාවෙන් මිල මුදල් අධික ලෙස වැයකර යුතුකම් සපුරාලීමට උත්සාහ කරන පිරිස් අද සුලභය. උසස් සමාජ ජීවිතයක් ගතකරන බෞද්ධයකු නම් ඔහු කීර්ති ප්‍රශංසා ලබා ගැනීමෙන් තොරව යුතුකම් ඉටුකිරීමයි.

''යොවේ පර කුලං ගන්ත්වා
භුත්වාන සුචි භෝජනං
ආගථං න පටි පූජේති
තං ජඤ්ඤා වසලො ඉති''

යනුවෙන් පරාභව සූත්‍රයේදී දේශනා කර ඇත්තේ අන්‍යයන් වෙත ගොස් රසවත් ආහාර පාන අනුභවකොට පැමිණියකු තමා වෙත පැමිණි විට ආගන්තුක සත්කාර නොකිරීම වසලයකු වීමට හේතුවක් බවයි. ධනය නිසි ලෙස පරිහරණය කරන්නා එබඳු වරදක් නොකරයි.

අංගුත්තර නිකායේම තවත් තැනක දක්වෙන අන්දමට පුද්ගලයෙකුට තමා නිවැරදිව ජීවත් වන්නේය යන හැඟීම ඇතිව අනවජ්ජ සැපය භුක්ති විඳීමට හැකි වන්නේ ඔහු විසින් පසුතැවිලි නොවීමට හේතුවන දේ සම්පූර්ණ කර ඇති විටයි. එම කරුණු නම් තමන් උපයාගත් ධනය හොඳින් පරිහරණය කර ඇතිබව, දුකට පත් අවස්ථාවල හොඳින් ධනය වැයකර එම දුක්වලින් අතමිදී ඇතිබව ලෝකෝත්තර සැප සාධනය පිණිස පරිත්‍යාග කර ඇති බව ආදියයි.මෙහිදී පුද්ගලයෙකුට ධනය උපයා ගැනීමේ අරමුණ තමන් ඉටු කරගන්නා ලදැයි අවංකව තීරණය කළ හැකි නම් ඔහු උසස් බෞද්ධයකු වනු ඇත.

# මරණාසන්න මොහොතේදී සිත ඇතිවන පශ්චාත්තාපයට හේතුවන කරුණු

**ති**ලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සමයෙහි කෝසල මහරජතුමා විහාරස්ථාන කටයුතු වලින් මඳකලකට ඉවත් වී කාම තෘෂ්ණාවෙහි ලොල් වී වාසය කරන කාල වකවානුවේදී බුදුන් වහන්සේගේ ගුණ සඳහන් කරුණු අසන්නට ලැබී බුදුන් වහනසේ නැවත දක්නට පැමිණ විහාරස්ථානයේ දී ආගිය පවත් කතා බහ කිරීමෙන් අණතුරුව කෝසල මහ රජතුමාට පූර්වාපාර සන්ධි ගලපා සත්ත්වයා පශ්චාත්තාපයට පත්වන කරුණු දහයක් පැහැදිලි කොට දේශනා කරන ලදි. මේ කරුණු දහය කෝසල මහ රජතුමාට පමණක් නොව වර්තමාන සමාජයට ජාති, කුල, ආගම් වලින් තොරව අවබෝධ කරගෙන ජීවිතය යහපත් කර ගැනීමට ප්‍රයෝජණවත් කර ගත් හැකිය.මේ කරුණු හුදෙක් බෞද්ධාගමටම බෞද්ධ ග්‍රන්ථ වලටම සීමා වී තිබිම, පිළිබඳව අපගේ අවධානය යොමු විය යුතුව ඇත. ජන සන්ථව ජාතකය" වශයෙන් මෙම ජාතක කතාව ජාතක පොතේ සඳහන්ව ඇත.

මනුෂ්‍යයා පශ්චාත්තාපයට පත්වන එම කරුණු එදාට මෙනම් වර්තමානයට ද බෙහෙවින් ගැලපෙන බව පැහැදිලිය.

**01.** තරුණ අවධියේදි රැකියා හා වෙළදාම් කටයුතු වලින් උපයා ගන්නා ධනය එම අවස්ථවේදීම අනාගතය වෙනුවෙන් ඉතිරි නොකොට විය පැහැදම් කොට වයෝවෘද්ධ කාලයේදී රැකෙන්නට මඟක් නොමැතිව සිටිනවිට නිසිකළ ධන උපයා අනාගතය වෙනුවෙන් ඉතිරිකොට සුව විඳින මිනිසුන් දෙස බලා මේ අයුරින් ධනය රැස්කොට ගැනීමට නොහැකි වුයේ යැයි සිතා සිත පශ්චාත්තාපයට පත්වීම.

**02.** යමෙක් බාල කාලයේදී නිසි පරිදි උගතමනා ශිල්ප ශාස්ත්‍රාදි ඉගෙන නොගෙන ශාස්ත්‍ර උගත් අය ඒ ශාස්ත්‍රයෙන් යැපෙන වැඩිහිටි පරපුර දෙස බලා වයෝවෘද්ධව දැන් කළ හැක්කක් නොමැතිව තමා නිසිකළ ශාස්ත්‍ර නූගත්කමේ විපාක සිතට දැනීමෙන් ඇති වන පශ්චාත්තාපය.

**03.** යම් අයෙක් බොරු හා කේලාම් කියමින් අල්ලස් රැගෙන තද පරුෂව (චණ්ඩිකමේන්) වාසය කොට මරණාසන්න කාලයේදී තමාගේ තරුණ කාලය නරක අයුරින් ගෙවා දැමීම පිළිබඳව සිහිපත් වීමෙන් මරණාසන්න මොහොතේදී දැනෙන පසුතැවිල්ල.

**04.** යම් පුද්ගලයෙක් පරපණ නසමින් අන්සතු වස්තුව විවිධාකාරයෙන් සොරාගෙන තරුණ වියේදී සැප සම්පත් ලබාගෙන ජීවත් වී වයේවෘද්ධ වූ කළ මරණාසන්න මොහොතේ දී කිසිවක් කළ නොහැකිව සිටින විට ඇතිවන සිතුවිලි වලින් පශ්චාත්තාපයට පත් වීම.

**05.** තවද යම් පුරුෂයෙක් තම විවාහක බිරිඳ සිටියදී පර ස්ත්‍රීන් ඇසුරු කොට කාම භෝගීව ජීවත් වෙමින් සිට මරණාසන්න මොහොතේ දී මම බොහෝ ස්ත්‍රීන් ඇසුරු කළේ යැයි සිතමින් පශ්චාත්තාපයට පත් වීම

**06.** යම් මනුෂ්‍යයෙක් බොහෝ සම්පත් ඇතිව සිටියදී දන් පින් නොකොට මරණාසන්න මොහොතේදී මේතාක් සම්පත් තිබියදී ත් පරලොව සඳහා උපකාරීවන කිසියම් වූ දනක් පිනක් නොකර ගන්නා ලද්දේ යැයි සිතා පසුතැවිල්ලට පත්වීම.

**07.** යම් මනුෂ්‍යයෙක් තම මව පියාට අත්පා මෙහෙවර තිබියදී එය නොසලකා හැර වයස්ගත වූ කළ මරණාසන්න මොහොතේ දී එවැනි කටයුතු කළ නොහැකි වූයේ යැයි පශ්චාත්තාපයට පත්වීම.

**08.** යම් මනුෂ්‍යයෙක් තමනට නිසිමඟ කියාදී ලාබාල කාලයේදී නිසි පෝෂණය ලබා දෙමින් ආරකෂා කර ගනිමින් ජීවත් වූ පියාණන් නොසලකා හැර තම පියාණන්ගේ බස් කමකට නැතැයි ආක්‍රෝෂ පරිභවකොට නොසලකා හැර පසුව මරණාසන්න මොහොතේදී තමා කරන ලද එම අනුවන ක්‍රියා සිහිපත් වීමෙන් ඇතිවන පසුතැවිල්ල.

**09.** යම් මනුෂ්‍යයෙක් ශ්‍රමණ බ්‍රාහ්මණ ආදී පූජ්‍ය පකෂයට දාන මාන දීම් ආදී කටයුතු වලින් මේ සා සම්පත් තිබියදීත් දන් පිං නොකොට ශ්‍රමණ බ්‍රාහ්මණ ආදී පිංවතුන් නොසලකා හරින ලද්දේ යැයි දැනෙන විට ඇති වන පශ්චාත්තාපය.

**10.** යම් මනුෂ්‍යයෙක් තුරුණු වියේදී සිල්වත් ගුණවත් කෙනෙකුන් ලඟට ගොස් සසරින් ගැලවීම පිණිස කිසියම් අවවාද අනුශාසනාවක් නොලබා වාසය කොට කටයුත්ත නොකටයුත්ත නොහැදින ජීවත් වී මරණාසන්න මොහොතේදී ඒ පිළිබඳව සිහිපත් වීමෙන් ඇතිවන පශ්චාත්තාපය.

මෙම දස වැදෑරුම් වූ පශ්චාත්තාපයට හේතුවන කරුණු වලින් වෙන්වීමට නම් සුදුසු කාලයේදී තමන් විසින් මතු දැක්වෙන කරුණු අවබෝධ කොට ගෙන කටයුතු කළ යුතුව ඇත. සිය පසිදුරන් බෙලහීන වී සියලු ක්‍රියා පිළිවෙත් අක්‍රීය වී මරණාසන්නව වැතිර සිටින විට තමන්ගේ සිත පමණක් ක්‍රියාකාරීවෙයි. සැබැවින්ම කලින් පටිගත කොට ගබඩා කරගෙන තිබූ හොඳ නරක චිත්‍රපට ඒ මොහොතේ දී සිට ප්‍රදර්ශනය වීමට පටන් ගනී. යහපත් දේ කළහොත් යහපත් සිතුවිලිද අයහපත් දේ කළ හොත් අයහපත් සිතුවිලි ද අවදී වී මරණින් මතු ජීවිතයට මඟ සරසයි. එබැවින් මරණාසන්න මොහොතේ දී සිත පශ්චාත්තාපයෙන් වලක්වා ගැනීමට මනස උසස් වූ මිනිසුන්ට මේ කරුණු වලින් උගත හැකි දේ බොහෝය.පසුව මරණාසන්න මොහොතේදී තමා කරන ලද එම අනුවන ක්‍රියා සිහිපත් වීමෙන් ඇතිවන පසුතැවිල්ල.

09. යම් මනුෂ්‍යයෙක් ශ්‍රමණ බ්‍රාහ්මණ ආදී පූජ්‍ය පකෂයට දාන මාන දීම් ආදී කටයුතු වලින් මේ සා සම්පත් තිබියදීත් දන් පිං නොකොට ශ්‍රමණ බ්‍රාහ්මණ ආදී පිංවතුන් නොසලකා හරින ලද්දේ

**යහපත් දේ කළහොත් යහපත් සිතුවිලිද අයහපත් දේ කළ හොත් අයහපත් සිතුවිලි ද අවදී වී මරණින් මතු ජීවිතයට මඟ සරසයි.**

යැයි දැනෙන විට ඇති වන පශ්චාත්තාපය.

10. යම් මනුෂ්‍යයෙක් තුරුණු වියේදී සිල්වත් ගුණවත් කෙනෙකුන් ලඟට ගොස් සසරින් ගැලවීම පිණිස කිසියම් අවවාද අනුශාසනාවක් නොලබා වාසය කොට කටයුත්ත නොකටයුත්ත නොහැදින ජීවත් වී මරණාසන්න මොහොතේදී ඒ පිළිබඳව සිහිපත් වීමෙන් ඇතිවන පශ්චාත්තාපය.

මෙම දස වැදෑරුම් වූ පශ්චාත්තාපයට හේතුවන කරුණු වලින් වෙන්වීමට නම් සුදුසු කාලයේදී තමන් විසින් මතු දැක්වෙන කරුණු අවබෝධ කොට ගෙන කටයුතු කළ යුතුව ඇත. සිය පසිදුරන් බෙලහීන වී සියලු ක්‍රියා පිළිවෙත් අක්‍රීය වී මරණාසන්නව වැතිර සිටින විට තමන්ගේ සිත පමණක් ක්‍රියාකාරීවෙයි. සැබැවින්ම කලින් පටිගත කොට ගබඩා කරගෙන තිබූ හොඳ නරක චිත්‍රපට ඒ මොහොතේ දී සිට ප්‍රදර්ශනය වීමට පටන් ගනී. යහපත් දේ කළහොත් යහපත් සිතුවිලිද අයහපත් දේ කළ හොත් අයහපත් සිතුවිලි ද අවදී වී මරණින් මතු ජීවිතයට මඟ සරසයි. එබැවින් මරණාසන්න මොහොතේ දී සිත පශ්චාත්තාපයෙන් වලක්වා ගැනීමට මනස උසස් වූ මිනිසුන්ට මේ කරුණු වලින් උගත හැකි දේ බොහෝය.

යූ.බී දිසානායක - කැකිරාව

# සංස්කෘත සාහිත්‍යයෙන් බුද්ධි වර්ධනයට

සංස්කෘත සාහිත්‍ය පොත්වල සඳහන් බොහෝ කරුණු මිනිස් දිවිය සාර්ථක කරගැනීම සඳහා ප්‍රයෝජනවත්ය. ඒවායේ සඳහන් තොරතුරු බෞද්ධ ධර්ශනයේ සඳහන් කරුණු වලට සමීප බවක් දැනේ.
අවියක් නැතිව කරන වද තුනක්

**රජවරුන්ට අණ කඩකිරීම**

1. ශ්‍රමණ බ්‍රාහ්මණයනට ගෞරව බහුමාන නොකිරීම.
2. භාර්යාවන්ට, සැමියා තනිව නිදා ගැනීම.

මේ ආවි ආයුධ නැතිව කරන වදයයි.**නිශ්ඵල කරුණු සතරක්**



01. මුහුදට වහින වැස්ස.
02. කුසපිරුණු තැනැත්තාට දෙන කෑම.
03. පොහොසතාට දෙන වස්තුව.
04. දවල්ට පත්තුකරන පහන්.

මේ කරුණු ඵලයක් ඇතිදෙයක් නොවන්නේය.

**ලෝකයෙහි දුක් ඇති සතරදෙනා**

01. දිළින්දා දුක් ඇත්තෙකි.
02. ණය ගැතියා ඔහුට වඩා දුක් ඇත්තෙකි.
03. නිතර නිතර රෝගාබාධයෙන් පෙලෙන්නා පළමු දෙදෙනාටම වඩා දුක් ඇත්තෙකි.
04. නරක භාර්යාවක් ලත් තැනැත්තා ඒ තුන්දෙනාටම වඩා දුක් ඇත්තෙකි.

මේ කරුණු දැන හඳුනාගත් විට ඒවායෙන් මිදී තමන්ගේ විමුක්තිය සාදා ගැනීමට හැකියාවක් ලැබේ. බොහෝ දෙනෙකු නොයෙකුත් හිරි හැර කරදර වලට මුහුණ පාන්නේ නිසි ලෙස කරුණු විමර්ශනය කිරීමට නොහැකි නිසාමය.

යූ.බී. දිසානායක



# බුදු සමිඳුගේ සිල් සුවඳ විශ්වයම සිසාරා හැමූහ

බුදුරාජාණන් වහන්සේ පිළිබඳ අවබෝධ කරගැනීම උදෙසා අපට භාවිතා කිරීමට ඇත්තේ උන්වහන්සේගේ ගුණ කඳම්භය හා බුදුහිමිම බුදුහිමි පිළිබඳ හඳුන්වා දුන් උපමා භාවිතයන්ය. ඒ අනුව බුදුහිමි යනු කවරෙක්ද  යන්න පිළිබඳ තරමක් දුරට වටහා ගැනීමට පුළුවන. සාමාන්‍ය පුහුදුන් වැසියාට බුදුහිමි යනු කවරක් ද කියා තේරුම් ගැනිමට තරම් දියුණු ප්‍රඥාවක් නොමැත.එයට හේතුව බුදුහිමි නික්ලේසි අසාමාන්‍ය ගුණ කදම්භයකින් යුතු ශ්‍රේෂ්ඨ උත්තමයකු වීමය.බුදුහිමි බුද්ධ ඥාණයෙන්ම දැක විවිධ අවස්ථා වලදී කරුණු කාරණා දේශනා කළහ.බුදුහිමි යනු කවරක් ද කියා සාමාන්‍ය වැසියාට පැහැදිලි කළ හොඳම අවස්ථාවක් ලෙස පද්මාකාර උපමාව හැඳින්වීමට පුළුවන.

අ.නි.චක්ක වග්ගයට අයත් ද්‍රෝණ (බ්‍රාහ්මණ ) සූත්‍රයේ සඳහන් පරිදි බුදුහිමිම බුදුහිමි කවුරුන්ද යන්න දේශනා කොට ඇත.බුදුහිමි උක්කට්ඨා නුවරත් සේතව්‍යා නුවරත් අතර මාර්ගයේ වඩිමින් සිටි  අවස්ථාවක එම මාර්ගයේම පසුව ගමන් කළ ද්‍රෝණ නම් බමුණා පාරේ සලකුණු වී තිබුණු විශේෂ පිය සටහන් පෙළක් දුටුවේය. දහසක් අර ඇති නිම් වළලු සහිත රෝද සලකුනු එම පිය සටහන්වල ඇති බව දුටු බමුණා පුදුම සහගතව මේ පිය සටහන් නම් මිනිසෙකුගේ වන්නට බැරි බව සිතා ඉදිරියට ගමන් කරන කල්හි බුදු හිමි ගසක් මුල වැඩ සිටි බව දැක එතනට ගොස් මෙසේ ප්‍රශ්න කළහ.

ද්‍රෝණ බමුණා - ඔබ දෙවියන් ද?
බුදු හිමි - නැත.බමුණ මම දෙවියෙක් නොවෙමි.
ද්‍රෝණ බමුණා - එහෙනම් ඔබ ගාන්ධර්වයෙක්ද?
බුදු හිමි - නැත.බමුණ මම ගාන්ධර්වයෙක් ද නොවෙමි.

ද්‍රෝණ බමුණා - ඔබ යක්ෂයෙක් ද?
බුදු හිමි - බමුණ මම යක්ෂයෙක්ද නොවෙමි.
ද්‍රෝණ බමුණා - එහෙනම් ඔබ මනුෂ්‍යයෙක් ද?
බුදු හිමි - බමුණ මම මනුෂ්‍යයෙක්ද නොවෙමි.

ඊට පසු බමුණා තවත් විශ්මයට පත්විය.මේ ලෝක ධාතුව තුළ සාමාන්‍යයෙන් ජීවත් වනවයි සිතන කිසිවෙකුට අයත් නොවන මොහු කවරෙක් විය හැකි ද?එවිට බුදුහිමි ඔහුට ඒ බව පහදා දෙන්නේ මෙලෙසිනි.බමුණ ඔබ ඇසූ සියළු දෙනාටම කාමාදි කෙලෙස් ඇත්තේ ය.නමුදු මම ඒ සියළු කෙලෙස් නැසූ හෙයින් අසාමාන්‍ය මනුෂ්‍යයෙක් වෙමි. ඒ බව වඩාත් පැහැදිලි කරදෙනු වස් බුදුහිමි පද්මාකාර උපමාව ගෙන හැර වදාළ සේක.

ජලයෙහි ඉපිදී ජලයෙහිම වැඩී ජලයෙන් ඉහළට මතු වී නමුත් ජලයෙහි නොගැවී සිටිනා මහනෙල් මලක් ,රත් නෙළුම් මලක් හෝ සුදු නෙළුම් මලක් පරිද්දෙන් බුදුහිමිද මිනිසුන් අතරම ඉපදී ,මිනිසුන් අතරම වැඩී මිනිසුන්ගෙන් ඉස්මතු වී මිනිසුන් සමඟ නොගැටී නොබැඳී ඉන්නා උත්තමයෙකි.බමුණ මම සියලු කෙලෙස් නැති කළ උසස් මනුෂ්‍යයෙක් වෙමි.මම බුදුවරයෙක් වෙමි.යනාදී වශයෙන් ද්‍රෝණ බමුණාට බදු හිමි කවරෙක් ද? යන වග පද්මාකාර උපමාව තුළින් බුදු හිමිම පහදා දුන් සේක.

ධම්ම පදයේ පුප්ඵ වග්ගය තුළින් ද මල් උපමා කොට ගෙන බුදුහිමි ඇතුළු රහතන් වහන්සේලාගේ සිල් ගුණ සුවඳ දේශානා කොට ඇත.ඒ අතර එම වග්ගයේ 16 වෙනි ගාථා  ධර්මය ඉතා වැදගත් වේ.

යථා සංකාර ධානස්මිං
උජ්ඣිතස්මිං මහාපථෙ
පදුමං තත්ථ ජායේථ
සුචි ගන්ධං මනෝරමං

මහමඟ අසළ දැමූ කුණු කසළ ගොඩක හටගැනෙන පියුමෙහි සුවඳ හා පැහැය සිත් කලුය.කසළ ගොඩාක් බදු වූ පුහුදුන් සත්වයා අතර පහළ වූ සම්බුදු සව්වෝ (රහත්වූ)පියුම සෙි මොනවට විකසිතව බැබළෙයි ද?සුවඳ වනාහි උන්වහන්සේලා තුළ පිහිටි සිල් සුවඳමය.පැහැය නම් නැණ ගුණ රැසය.සිල් නමැති සුවඳෙහි හා නැණ ගුණ තුළ නමැති පැහැයෙහි දෙව් මිනිසුන්ගේ සිත් ඇලෙන්නේය.
බුදු හිමිගේ චරිත කථාව කියවීමෙන් පැහැදිලි වන්නේ උන්වහන්සේ කිසිදු කෙනෙකු සමඟ නොගැටී නොබැඳී පියුමක් සේ දියේ නොගැටී සුවඳ හැමූ ආකාරායයි.

වදකේ දේව දත්තම්හි
චෝරේ අංගුලි මාලකේ
ධනපාලේ රාහුලේ චේව
සාම මිත්තේව මානසෝ

උන්වහනසේ තුළ පැවැති කරුණාව, මෛත්‍රිය, අනුකම්පාව සියල්ලෝටම පොදු වූවක් විය.තම පුත් රාහුල කුමරුටද, දේවදත්ත, අංගුලිමාල වැනි දරුණු අයටද තිරිසන් සතුනටද ආදී වශයෙන් සියල්ලෝටම එම කරුණාවෙහි වෙනසක් බේදීමක් නොවීය. සමාජයේ විවිධ පුද්ගලයින් උදෙසා ගව් ගණන් පයින්ම වැඩම කොට පිහිට ලබා දුන්හ.සුඛෝ බුද්ධානං උප්පාදෝ බුදුවරයින්ගේ පහළ වීම සැපතක් වන්නේ හැම සත්වයෙකුටම බුදු කරුණාව, දයාව, මෛත්‍රීය, අනුකම්පාව සම සිතින් ලබාදීමය.මෙලොව පරලොව සුභ සිද්ධිය සැලසීම හා දුකින් නිදහස් වන නිවන් මඟ පාදා දීම අත්වින්ද බුදුවරු සමව කටයුතු කරන්නාහ.

එංගලන්තයේ කෙන්ට් ප්‍රදේශයේ පිහිටි ග්‍රේව්ස්එන්ඩ් නගරයෙහි උපත ලද එඩ්වින් ආර්නෝල්ඩ් පසු කාලයේ ඉන්දියානු සිවිල් සේවයට බැඳී සේවය කරමින් සිටියදී සංස්කෘත, පාලි භාෂාවන් ඉගෙන බුදු හිමිගේ චරිත කතාව කියවා The Light Of Asia නම් කෘතිය රචනා කළහ. බුදුහිමි පිළිබඳ වර්ණනාත්මකව එම කෘතිය තුළින් විස්තර කොට ඇත. එය පසු කළ ආසියා පෙහෙළිය නමින් විනී විතාරණ විද්වතානෝ සිංහලටද පර්වර්තනය කළහ. එඩ්වින් ආර්නෝල්ඩ් විදවතානෝ තම කෘතිය තුළින් බුදුහිමි පිළිබඳ මෙසේ පවසා ඇත.

''බුදු රජු අපේ මානව වෘක්ෂයේ පිපුණු මලයි. ඒ මල පිපෙන්නේ අසීමිත ලක්ෂ සංඛ්‍යාත වසර ගණනකට පසුවය. එයින් වහනය වන ප්‍රඥා සුගන්ධයෙනුත් ඇද හැලෙන දයාව නමැති මකරන්දයෙනුත් ලෝකය පිරී යයි.''

ලොව විවිධ විද්වතුන් බුදුහිමි පිළිබඳ හදාරා උන්වහන්සේ පිළිබඳ ගුණ වර්ණනා කරයි.අද ලෝකය තුළ බුදුහිමිට කෙරෙන ගෞරව පුද සත්කාර නිමක් නැත.වෙසක් පොහොය උදාවන විට බුදුහිමිගේ තෙමඟුල සමරා බොහෝ පිංකම් කෙරෙති. බුදුහිමි පිරිනිවන් පා දිගු කාලක් ගත වූව ද බුදුහිමි වෙනුවෙන් කෙරෙන පුද සත්කාරවල කිසිදු අඩුවක් නොමැත.මොහොතක් ගානේ බුදුහිමි කෙරෙහි පවතින ගෞරවය වැඩි වෙනවා මිසක අඩුවීමක් දක්නට නැත. එය කිසිවෙකුටවත් නැති කිරීමට නුපුළුවන. උන්වහන්සේ සසර පුරන ලද පාරමී ශක්තිය මහපොළොව, මහා සාගරය පරයා ඉස්මතු වනු ඇත. එය එදාටත් වඩා අද අපට දැනෙනු ඇත. උන්වහන්සේගේ කාමයට පවා ගස්වැල් වල මල් පිපෙති. ගෙඩි හට ගනිති. මල් පූජා කිරීමේදී අනිත්‍ය මෙනෙහි කරමින් ජීවිතය පිළිබඳ යථාර්තවබෝධය ලබා ගැනීමට පුළුවන.පියුමක් බඳු අප බුදුසමිදාණෝ තුන් ලොවටම අග්‍ර වූ ශ්‍රේෂ්ඨ උත්තමයාණෝය. උන්වහන්සේගේ ගුණ කදම්භය සිහිකොට දාන,සිල,භාවානාදී උතුම් පිංකම් කිරීමටත් ගුණ ධර්ම ප්‍රගුණ කරමින් සසර දුකින් අත් මිදී ලබන නිර්වාණ ශාන්තිය සෘාත් සෘාත් කරගැනීමටත් උත්සාහත් විය යුතුය.

මහව, උඩගම ශ්‍රී ඉන්දසුමන මහ පිරිවෙන්හි,
ප්‍රවීණාචාර්ය,ප්‍රවචන කීර්ති ශ්‍රී ලේඛණ ශාස්ත්‍රී,
ගලගෙදර රතනවංශ ස්ථවිර